Australian Aid

Skills for Inclusive Growth

TVEC

# සංචාරක නිපුණතා පාදක ක්‍රමෝපායික ක්‍රියාකාරී සැලැස්ම

## අනුරාධපුර දිස්ත්‍රික්කය



# පණිවිඩය

## අධ්‍යක්ෂ ජනරාල්



සංචාරක ක්ෂේත්‍රයේ නියැලී සිටින පාර්ශවකරුවන් සමග එක්ව අනුරාධපුර සහ මාතලේ දිස්ත්‍රික්ක සඳහා නිපුණතා පාදක ක්‍රමෝපායික සැලැස්මක් සකස් කිරීමට සහයවීම සම්බන්ධයෙන් පළමුව මාගේ ස්තුතිය, අන්තර්කරණීය වර්ධනය උදෙසා නිපුණතා (Skills for inclusive growth) වැඩසටහන වෙත පිරි නමමි.

වෘත්තීය නිපුණතා සැලසුම් විවිධ ක්ෂේත්‍රයන්ද ආවරණය කරමින් සකස් කරනු ලැබුවද දිස්ත්‍රික් මට්ටමින් මෙවැනි ඉල්ලුමක් පවතින වෘත්තීය ක්ෂේත්‍රයක් සඳහා සියලු ආයතනයන්හි සම්බන්ධතාවය සහිතව නිපුණතා සැලසුම් සකස් කිරීමක් කර නොතිබූ අතර මෙම නිපුණතා සැලැස්මේදී මූලික වශයෙන් සංචාරක ක්ෂේත්‍රය තෝරාගෙන ඇති අතර දිස්ත්‍රික්කයේ පවතින නිපුණතා ගැටළු වලට පිළියම් යෙදීම සඳහා අදහස් හා යෝජනා ඇතුලත්ව ඇති බැවින් නිපුණතා සංවර්ධන සඳහා වූ පොදු තීරණ ගැනීමේදී මහත් පිටුවහලක් වනු ඇත.

මෙම සැලැස්ම සකස් කිරීමේදී අප ආයතනය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පමණක් නොව සංචාරක කර්මාන්තයේ එකිනෙකට සම්බන්ධ වී සිටින සියලු පාර්ශව කරුවන් සම්බන්ධ කරගනිමින් දිස්ත්‍රික්කයන්හි පවතින නිපුණතා අවශ්‍යතාවයන් සහ ගැටළු සම්බන්ධ ක්ෂේත්‍ර හදුනා ගෙන ඇත. එමෙන්ම එකී ගැටලු සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හා පිරියම්ද සියළු දෙනාගේ එකගත්වයෙන් හදුනාගෙන තිබීම සුවිශේෂී වේ.

මෙම සැලැස්ම සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය හා එහි නිපුනතා සංවර්ධනය උදෙසා වැදගත්වනු ඇත. මෙය ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒම සඳහා අප සියලු දෙනා එක්ව කටයුතු කළ යුතුය. ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පළාත් සභාව , තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වෘත්තීය පුහුණු ආයතන, පෞද්ගලික ආයතන, රාජ්‍ය නොවන ආයතන ගත යුතු ක්‍රියාමාර්ග මෙම සැලැස්ම මගින් හදුනාගෙන ඇති හෙයින් ක්‍රියාකාරකම් ප්‍රයෝගික තත්වයට පත් කිරීම සඳහා කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගත යුතු අතර එය අප ආයතනයේ දායකත්වය සහිතව ක්‍රියාත්මක කිරීම ප්‍රධාන අපේක්ෂාවකි .

මෙමගින් ලබාගත් දැනුම හා ක්‍රමවේදය අප ආයතනය විසින් අනෙකුත් දිස්ත්‍රික්ක සඳහාද ලබාදීමට බලාපොරොත්තු වන අතර මෙම සැලැස්ම ක්‍රියාත්මක කරමින් අනෙකුත් දිස්ත්‍රික්ක සඳහාද ආදර්ශයක් හා මගපෙන්වීමක් ලබාදීමට මාතලේ සහ අනුරාධපුර දිස්ත්‍රික් දෙකට හැකිවන බව මාගේ විශ්වාසය වන අතර මේ සඳහා දායක වූ සියළුම පාර්ශවයන්ට මාගේ හර්දයාංගම කෘතඥතාවය පළකරමි.

**ආචාර්ය කේ.ඒ. ලලිතධීර**
අධ්‍යක්ෂ ජනරාල්,
තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

# පණිවිඩය

## දිසාපති / දිස්ත්‍රික් ලේකම් - අනුරාධපුරය



මෙරට සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ප්‍රවර්ධනය කළ යුතු සුවිශේෂීම ක්ෂේත්‍රයක් වන්නේ සංචාරක කර්මාන්තය යි. එහි ලා අනුරාධපුර දිස්ත්‍රික්කය ඉහළ සුවිශේෂීත්වයක් ගනී. එම නිසා දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය පවතින තත්ත්වයෙන් ඉහළට ගෙන ඒම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග රාශියක් පවතී. ඒවා උපාය මාර්ගිකව සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කාලෝචිත ක්‍රියාමාර්ගයකි.

මෙම තත්ත්වය වටහා ගනිමින්, "Skill for Inclusive Growth" වැඩසටහන මගින් හරවත් උත්සාහයක් ගෙන තිබේ. මෙහි දී සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ මානව සම්පතෙහි කුසලතා ප්‍රවර්ධනයට විශාල ඉඩකඩක් ලබා දී ඇත. සංචාරක කර්මාන්තයෙන් දේශීය හා විදේශීය වශයෙන් ඉහළ ආදායමක් ඉපයීමට අවශ්‍ය සම්පත් සමූහයක් දිස්ත්‍රික්කය තුළ පවතී. ඒවායින් ප්‍රතිලාභ ලැබීමට නම් අලෙවිකරණය, කළමනාකරණය, මානව සම්පත් ප්‍රවර්ධනය, නිෂ්පාදන මෙහෙයුම්, මූල්‍ය පාලනය, තාක්ෂණ ඥානය ගැලපීම ආදිය නිසි ලෙස සිදුකර ක්ෂේත්‍රය බලගැන්විය යුතුයි. මේ සියලු කාරනා සහිතව 2023 - 2025 කාලය තුල සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා “නිපුණතා සංවර්ධන උපායමාර්ගික සැලැස්මක්” සකස් කිරීමේ පියවර ගැනීම අතිශය අගය කළ යුතුයි. එමෙන්ම ඒ සදහා මාගේ හදපිරි සුබපැතුම් ගෙන එන්නෙමි.

මෙම උපාය මාර්ගික නිපුනතා සංවර්ධන සැලැස්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියලු ක්ෂේත්‍ර ඒකාබද්ධ කර ගනිමින් එහි ක්‍රියාකාරකම් ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කිරීම අරමුණු කර සකස් කර ඇත. විශේෂයෙන්ම රාජ්‍ය අංශය මගින් මෙබදු බහු ආංශික ප්‍රවර්ධන වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම පහසු නොවේ. ඒ නයින් S4IG වැඩසටහන ගෙන ඇති මෙම ක්‍රියාමාර්ගය ඉහළ අගය කළ යුත්තකි. රාජ්‍ය නිලධාරීන්ගේ මෙන්ම ව්‍යවසායකයින්ගේ, සංචාරක සේවා සපයන්නන්ගේ සහ සංචාරක සේවා වෘත්තීන්හි නියලී සේවකයින්ගේ නිපුණතා ප්‍රවර්ධනය සඳහා වඩාත් ප්‍රයෝගික සැලැස්මක් සකස් කිරීමෙන් සහ එය ක්‍රියාත්මක කිරීමෙන් දිස්ත්‍රික්කයේ සංචාරක සංවර්ධනය ඉතා ඉහළ මට්ටමකට ඉදිරි වසර කිහිපය තුළ දී ගෙන ඒමට හැකි වෙතැයි යන්න මාගේ බලාපොරොත්තුව යි.

ඒ සම්බන්ධයෙන් මූල්‍යමය වශයෙන් සහය දක්වන ඔස්ට්‍රේලියානු මහකොමසාරිස් කාර්යාලය මෙන්ම ඔස්ට්‍රේලියානු ජනතාව ද සිහිපත් කළ යුතුයි.

ධරණීය සංවර්ධනයක් සංචාරක ක්ෂේත්‍රය තුල ද ගොඩනගමින් රටෙහි සංවර්ධනයට අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ක්ෂේත්‍රයෙන් ඉහළ දායකත්වයක් දැක්වීමට, මෙම වැඩසටහන හරහා ගන්නා පියවරයන් ඔස්සේ හැකිවේවා යන්න මාගේ ප්‍රාර්ථනය යි.

**ජනක ජයසුන්දර**
දිසාපති / දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර

# පණිවිඩය

## අධ්‍යක්ෂ (සැලසුම්) - අනුරාධපුරය



අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහයෝගය ඇතිව දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයේ නිපුනතාවන් නංවාලීම සඳහා S4IG ව්‍යාපෘතිය විසින් ආරම්භ කර සකස් කරන ලද අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා පිළියෙළ කරන ලද සංචාරක ක්ෂේත්‍රයේ නිපුනතා සංවර්ධන උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම එළිදැක්වීමේ අවස්ථාවේදී ඒ පිලිබඳ පණිවිඩයක් ලබා දීමට හැකිවීම සතුටට කරුණකි. එමෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වර්ධනයට දායක වෙමින් සංචාරක කර්මාන්ත සංවර්ධනය සඳහා වන කටයුතු වල නියැලෙන විශිෂ්ට කණ්ඩායමේ සෑම සාමාජිකයෙකුටම මාගේ උණුසුම් සුබපැතුම් සහ හෘදයාංගම ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමි.

අනුරාධපුර දිස්ත්‍රික්කය ඉපැරණි නගරයක් වන අතර යුනෙස්කෝ ලෝක උරුම භූමියක් වන අතර, එය පොහොසත් ඓතිහාසික හා සංස්කෘතික වැදගත්කම නිසා ප්‍රසිද්ධියට පත්ව ඇත. මෙම ඓතිහාසික නගරය, ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ පිහිටා ඇත. එය විශාල සංස්කෘතික, ආගමික සහ ඓතිහාසික වැදගත්කමක් දරණ අතරම, එය රටෙහි වඩාත් කැපී පෙනෙන සංචාරක ගමනාන්තයක් ද වේ. අනුරාධපුරයේ වැදගත්කම පවතින්නේ එහි ඓතිහාසික, සංස්කෘතික, ආගමික සහ අධ්‍යාපනික වැදගත්කම තුළය. එය ශ්‍රී ලංකාවේ උරුමයේ ජීවමාන සාක්ෂියක් ලෙස ක්‍රියා කරන අතර, එය සංචාරකයින්, පර්යේෂකයන් සහ වන්දනාකරුවන් එකසේ ආකර්ෂණය කරයි. නගරය සංරක්ෂණය කිරීම, යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස පිළිගැනීම සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි එහි බලපෑම දේශීය ආර්ථිකයට, සංස්කෘතික හුවමාරුවට සහ ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාවය ප්‍රවර්ධනය කිරීමට දායක වේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය ආර්ථික වර්ධනයේ වැදගත් ධාවකයක් ලෙස ක්‍රියාකරමින් ආදායම් සහ රැකියා අවස්ථා උත්පාදනය කිරීම සිදු කෙරේ. එමෙන්ම, සංචාරක ව්‍යාපාරය සංවර්ධනය මගින් ව්‍යවසායකත්වය සහ කුඩා ව්‍යාපාර සංවර්ධනය සඳහා ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබල ගැන්විය හැකි වේ. දේශීය කර්මාන්තකරුවන්ට, ශිල්පීන්ට සහ අලෙවිකරුවන්ට ඔවුන්ගේ නිෂ්පාදන සහ සේවා සංචාරකයින් වෙත ගෙන ඒමට හැකි වන අතර, එමඟින් සාම්ප්‍රදායික කලා, අත්කම් සහ දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කළ හැකිය. අනුරාධපුරය දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරයේ වර්ධනය රැකියා සඳහා සෘජු බලපෑමක් ඇති කරයි. මෙම අංශය, සංචාරක මාර්ගෝපදේශකයන්, හෝටල් කාර්ය මණ්ඩලය, රියදුරන්, ශිල්පීන් සහ සිල්ලර සේවකයින් වැනි විවිධ ක්ෂේත්‍රවල රැකියා උත්පාදනය කරයි. තවද, මෙය විරැකියාව තුරන් කිරීමට උපකාරී වන අතර, ප්‍රාදේශීය ප්‍රජාවන්ට ආදායම් උත්පාදන අවස්ථා සලසා දෙන අතරම, දරිද්‍රතාවය අඩු කිරීමට සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට එය දායක වේ.

එබැවින්, ඓතිහාසික වැදගත්කම, ආර්ථික බලපෑම, රැකියා අවස්ථා, යටිතල පහසුකම් සංවර්ධනය, සංස්කෘතික හුවමාරුව සහ සංරක්ෂණ ප්‍රයත්නයන් හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රය අනුරාධපුරයට අත්‍යවශ්‍ය වේ. එපමණක් නොව, සංචාරක ව්‍යාපාරය, අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා ඉමහත් වැදගත්කමක් දරන අතරම, එය ආර්ථික වාසිවලින් ඔබ්බට විහිදෙන ප්‍රතිලාභ රාශියක් ලබා දෙයි. සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම, ආර්ථික වර්ධනය, ප්‍රජා සංවර්ධනය, තිරසාර භාවිතයන් සහ ජාතික අනන්‍යතාවය ප්‍රවර්ධනය කිරීම තුළින් සංචාරක ව්‍යාපාරය කලාපයේ සමෘද්ධිය සහ යහපැවැත්ම සඳහා ගාමක බලවේගයක් ලෙස ක්‍රියා කරයි.

සංස්කෘතික උරුමයන් සුරැකීමට, ආර්ථික වර්ධනය උත්තේජනය කිරීමට, අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට, ප්‍රාදේශීය ප්‍රජාව සම්බන්ධ කර ගැනීමට සහ පාරිසරික තිරසාරභාවය සහතික කිරීමට අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා සංචාරක සංවර්ධන ක්‍රියාකාරී සැලැස්මක් ඉතා අත්‍යවශ්‍ය වේ. එවැනි සැලැස්මක් ක්‍රියාත්මක කිරීම තුලින් දිස්ත්‍රික්කයේ සංචාරක සංවර්ධනය සඳහා සමබර ප්‍රවේශයක් ලබා ගත හැකි අතර, එහි පදිංචිකරුවන්ට, සංචාරකයන්ට සහ සමස්තයක් ලෙස මෙම ගමනාන්තයට ධනාත්මක බලපෑමක් ඇති කරයි. එබැවින්, විශේෂයෙන්ම ඉල්ලුම මත පදනම්

## පණිවිඩය - අධ්‍යක්ෂ (සැලසුම්) - අනුරාධපුරය

වූ නිපුණතා පුහුණුව (ව්‍යාපාර පදනම්ව) සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපාර සංවර්ධනය සම්බන්ධයෙන් මෙම ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ක්‍රියාමාර්ග සඳහා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සහ සංචාරක අමාත්‍යාංශය ඔවුන්ගේ පූර්ණ සහයෝගය ලබා දෙනු ඇතැයි මම ප්‍රාර්ථනා කරමි.

ඒ අනුව, මෙම ක්‍රියාකාරී සැලැස්ම සාර්ථක කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය සහ වෙළඳ සංගම්, රාජ්‍ය නොවන සංවිධාන, දිස්ත්‍රික්කයේ රාජ්‍ය සහ පෞද්ගලික පුහුණු සපයන්නන් සහ ප්‍රජා මූල සංවිධාන ඔවුන්ගේ අදහස් ලබා දීමෙන් දැක්වූ දායකත්වය මම ඉතා අගය කරමි. තවද, මෙම ක්‍රියාකාරී සැලැස්ම හරහා දිස්ත්‍රික්කයේ සංචාරක ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ වෘත්තීයභාවය සහ රැකියා වැඩි දියුණු කිරීමට ගන්නා උත්සාහය මම ඉතා අගය කරමි. තවද, දිස්ත්‍රික් සංචාරක කර්මාන්තය සඳහා සංචාරක කුසලතා උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කිරීමට මූලිකත්වය ගැනීම සම්බන්ධයෙන් ඕසේට්‍රේලියානු රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක වන S4IG ව්‍යාපෘතියට අවංකවම ස්තූතිවන්ත වෙමි.

ඒකාබද්ධ වූ ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වන සියලුම හවුල්කරුවන්ට මම සුබ පතමි.

**සුගත් නයනානන්ද**
අධ්‍යක්ෂ (සැලසුම්)
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අනුරාධපුර

# පණිවිඩය

## අධ්‍යක්ෂ - උතුරු මැද පළාත



සංචාරක ක්ෂේත්‍රයේ නියුක්ත මානව සම්පතේ නිපුනතා සංවර්ධනය සඳහා උර දී කටයුතු කරනු ලබන "Skill for Inclusive Growth" ආයතනය විසින් පළමු වරට අනුරාධපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් සකස් කරන ලද නිපුණතා සංවර්ධන සැලැස්ම සඳහා මාගේ සුබ පැතුම් එකතු කරනු ලබන්නේ හද පිරි සතුටිනි. ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලැබෙන දෙවැනි ප්‍රධානතම ආදායම් ප්‍රභවය වන්නේ සංචාරක කර්මාන්තයයි. සංචාරක ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය සඳහා එතරම් අවධානයක් යොමු නොවී තිබෙන මෙවන් අවධියක ඔබ ආයතනය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය බෙහෙවින් පැසසිය යුතු වේ. විශේෂයෙන් ම සංචාරක සත්කාරක ක්ෂේත්‍රයට අදාල ව පවතින නිපුනතා අවශ්‍යතා හදුනා ගැනීම මෙන්ම වර්තමානයේ පවතින නිපුනතා පරතරය පිලිබඳ අවබෝධයක් ලබා ගැනීම තුලින් අනාගත මානව සම්පත සතුවිය යුතු සංචාරක සත්කාරක නිපුණතාවයන් අනාවරණය කර  ගැනීමට එමගින් හැකියාව ලැබේ. ඒ අනුව, එමගින් මෙම ක්ෂේත්‍රයේ කටයුතු කිරීමට නියමිත ඉදිරි මානව සම්පත සතුවිය යුතු කුසලතා පරාසය හඳුනාගත හැකි වනු ලබන අතර ඒ ඔස්සේ අනාගත සංචාරක ක්ෂේත්‍රයේ බිහිවන රැකියා පිලිබඳ පුරෝකථනයක් ද ලබා දීමට හැකි වනු ඇත. එසේම ගෝලීය සංචාරක සත්කාර රැකියා වෙළඳපොල විශ්ල්ලේෂණය කර එම රැකියා අවස්ථා සඳහා සුදුසු ලෙස අපගේ මානව සම්පත සූදානම් කරවීමට ද මෙම නිපුනතා පරතරය හඳුනා ගැනීම ඉතාමත්ම වැදගත් වේ. එම අවශ්‍යතාවය හඳුනාගත් ඔබ ආයතනයේ කණ්ඩායම් නායක සහ කළමනාකරණ කණ්ඩායමට මෙන්ම ඔස්ට්‍රේලියානු මහා කොමසාරිස් කාර්යාලයට හා ප්‍රතිපාදන ලබා දෙන ඔස්ට්‍රේලියානු ජනතාවට ද මාගේ කෘතඥතාව පුද කර සිටිමි.

මෙම කාලීන අවශ්‍යතාවය හඳුනාගත් "Skill for Inclusive Growth" ආයතනය උතුරු මැද පළාතේ සංචාරක සත්කාරක ක්ෂේත්‍රයේ  කටයුතු කරනු ලබන  රාජ්‍ය සහ පුද්ගලික ආයතනවල සහයෝගය ද සහිතව ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් ද ඒකාබද්ධ කර ගනිමින් සකස් කරනු ලබන අනුරාධපුර දිස්ත්‍රික් “නිපුනතා සංවර්ධන උපායමාර්ගික සැලැස්ම” මෙම දිස්ත්‍රික්කයේ සංචාරක හා සත්කාර සේවා ක්ෂේත්‍රයේ විශාල ඉදිරි පිම්මක් වනු ඇති බව මාගේ විශ්වාසයයි. මෙම සැලැස්ම තවත් එක් ලේඛනයක් බවට පත්වීමට ඉඩ නොහැර ප්‍රායෝගික භාවිතය සඳහා යොදාගත හැකි අත්පොතක් බවට එය යොදාගැනීමට සංචාරක ක්ෂේත්‍රයේ කටයුතු කරනු ලබන සියලු රාජ්‍ය හා පුද්ගලික ආයතන කැප වී කටයුතු කල යුතුවේ. එම ඉලක්කය ජයගනිමින් මෙම පළාතේ සංචාරක ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වෙනසක් සිදු කරමින් ජාතික ආර්ථිකයට ඉහල දායකත්වයක් ලබා දීමට සැමට ශක්තිය හා දිරිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමි.

**නීතීඥ එන්.බී.ක්‍රිෂාන්ත කුමාර**
අධ්‍යක්ෂ
පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව
උතුරු මැද පළාත

# අන්තර්ගතය


**වගු ලැයිස්තුව** **8**

**රූප ලැයිස්තුව** **8**

**කෙටි යෙදුම්** **9**

**විධායක සාරාංශය** **10**

**පරිච්ඡේදය 1: හැඳින්වීම** **12**

1.1 හැඳින්වීම 13

1.2 පසුබිම 14

1.3 සැලැස්මේ අරමුණු 14

1.4 SSAP සංවර්ධනය සඳහා භාවිතා කරන ප්‍රවේශය. 15

1.5 SSAP හි දළ විශ්ලේෂණය 15

**පරිච්ඡේදය 2: අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ සංවර්ධනයට ඇති අවස්ථා සහ උපාය මාර්ගික දිශානතිය** **16**

2.1 හැඳින්වීම 17

2.2 මහා පරිමාණ ආර්ථිකය 17

2.3 කලාපීය ආර්ථිකය 17

2.4 අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශය 19

2.5 අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිපුණතා සංවර්ධන තත්ත්වය 24

2.6 ශ්‍රම වෙළඳපොලේ අඩු කුසලතා සමතුලිතතාවය පිළිබඳ සාක්ෂි 25

2.7 ජාතික සහ දිස්ත්‍රික් මට්ටමින් සංචාරක අංශය සඳහා ප්‍රතිපත්ති උපදෙස් 26

2.8 ආයතනික ආධාරක පද්ධතිය 27

2.9 සාරාංශය 28

**පරිච්ඡේදය 3: සංචාරක වටිනාකම් දාමයේ කුසලතා සංවර්ධනය සඳහා වන අභියෝග සහ උපාය මාර්ග** **29**

3.1 හැඳින්වීම 30

3.2 ඉල්ලුම් සහ සැපයුම් අංශ වල සීමාවන් 31

3.3 කුසලතා සංවර්ධනය සඳහා ඇති අභියෝග සහ අවස්ථා 31

3.4 SWOT විශ්ලේෂණය 32

3.5 අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිපුණතා සංවර්ධන දැක්ම 33

3.6 කුසලතා සංවර්ධනය සඳහා උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම 34

**පරිච්ඡේදය 4: සාරාංශය සහ නිර්දේශ** **40**

4.1 සමස්ත අදහස් 41

4.2 ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම 42

**References** **43**

**Annexes** **44**

# වගු ලැයිස්තුව


වගුව 2. 1 : අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශ්‍රම බලකා තත්ත්වය 2021 19

වගුව 2. 2 : අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක වටිනාකම් දාමයේ රැකියා නියුක්තිය - 2021 (සේවක සංඛ්‍යාව) 20

වගුව 3. 1 : අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයේ නිපුණතා සංවර්ධනයේදී මුහුණ දීමට සිදුවන අභියෝ. 32

වගුව 3. 2 : මූලික ඉල්ලුම් සහ සැපයුම් උපාය මාර්ග සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්වීම් 35

වගුව 3. 3 : අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා සංචාරක අංශයේ නිපුණතා සංවර්ධන සැලැස්ම 2023-2024 36


# රූප ලැයිස්තුව


රූපය 2.1: අනුරාධපුර දිස්තික්කයේ රැකියා ව්‍යුහය -2022 % 18

රූපය 2.2: කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපාර හිමිකරුගේ පුහුණුව - % 21

රූපය 2.3: 2020 දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයේ කාර්ය සාධනය 22

රූපය 2.4: අනුරාධපුර දිස්ත්‍රික්කයේ විදේශීය අමුත්තන් නැවත ස්තාපිත වීම - අමුත්තන්ගේ රාත්‍රීන් 22

රූපය 2.5: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවන චක්‍රය 23

රූපය 2.6: අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ නිපුණතා සංවර්ධනයේ හවුල්කරුවන්% 24

රූපය 2.7: ඉහළ නිපුණතා සහිත සේවකයින් අතර නිපුණතා හිඩැස් 25

රූපය 2.8: මධ්‍යම නිපුණතා මට්ටමේ සේවකයින් අතර නිපුණතා හිඩැස් 25

රූපය 2.9: අඩු නිපුණතා මට්ටමේ සේවකයින් අතර නිපුණතා හිඩැස් 26

රූපය 3.1: අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයේ නිපුණතා සංවර්ධනය පිළිබඳව සිදු කරන ලද SWOT විශ්ලේෂණය 32

# කෙටි යෙදුම්

| | |
|---|---|
| ADB | ආසියානු සංවර්ධන බැංකුව |
| CBSL | ශ්‍රී ලංකා මහ බැංකුව |
| DCS | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| F&B | ආහාර සහ පාන වර්ග |
| GCE | සාමාන්‍ය අධ්‍යාපන සහතිකය |
| GCI | ගෝලීය තරඟකාරීත්ව දර්ශකය |
| GDP | දළ දේශීය නිෂ්පාදනය |
| GOSL | ශ්‍රී ලංකා රජය |
| HRD | මානව සම්පත් සංවර්ධනය |
| H&T | හෝටල් සහ සංචාරක |
| IE | අවිධිමත් ආර්ථිකය |
| IMF | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල |
| NAITA | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය |
| NPD | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව |
| MSME | ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය |
| QLFS | කාර්තුමය කම්කරු බල සමීක්ෂණය |
| SLITHM | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය |

# විධායක සාරාංශය

අනුරාධපුර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ වඩාත් ජනප්‍රිය සංචාරක ගමනාන්තයකි. එය විදේශීය සහ දේශීය අමුත්තන් සඳහා විවිධාකාර ආකර්ශනීය ස්ථාන වලින් සමන්විත වන අතර දිස්ත්‍රික්කයේ සංචාරක වටිනාකම් දාමය විවිධ උප අංශ 12 කින් නියෝජනය කරයි. පුරාණ ශිෂ්ටාචාරයේ හොඳින් සංරක්ෂණය කර ඇති නටබුන් හේතුවෙන් මෙම නගරය යුනෙස්කෝව විසින් ලෝක උරුම අඩවියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ස්ථානවලින් එකකි.

සංචාරක ව්‍යාපාරය දිස්ත්‍රික්කයේ ඉහළ වර්ධන අංශයක් වන අතර පුහුණු හා නුපුහුණු ශ්‍රමය අවශෝෂණය කර දිස්ත්‍රික් ආර්ථිකයට අවශ්‍ය ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව එයට ඇත. පූර්ව කොවිඩ් කාලපරිච්ඡේදය තුළ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය සඳහා වූ විදේශීය ඉල්ලුම අමුත්තන්ගේ රාත්‍රී 228,000 ක් පමණ වූ අතර එය COVID අර්බුධකාරී කාල සීමාව තුළ සම්පූර්ණයෙන්ම කඩා වැටුණි. 2021 දී මුළු විදේශ ඉල්ලුම වූයේ පූර්ව COVID ඉල්ලුමෙන් 1% ක් පමණි. 2022 දී, එය පූර්ව covid ඉල්ලුමට සාපේක්ෂව 47% ක ප්‍රකෘතිමත් වීමක් නියෝජනය කරමින් 99,000 දක්වා වැඩි විය. පූර්ව COVID කාලය තුළ විදේශීය සහ දේශීය අමුත්තන් අතර වෙළඳපල කොටස පිළිවෙලින් 77% සහ 23% විය.

අනුරාධපුරයේ දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ගමනාගමනය බොහෝ දුරට නගර ප්‍රදේශය කේන්ද්‍ර ව ඇති අතර ප්‍රධාන වශයෙන් පුරාණ නගරයට සීමා වී ඇත. මේ අනුව, දැනට පවතින දුර්වල වටිනාකම් දාම සම්බන්ධතා නිසා සංචාරක කර්මාන්තය ආශ්‍රිත ප්‍රතිලාභ ගලායාමෙන් දේශීය ආර්ථිකයට කිසිදු ප්‍රතිලාභයක් නොලැබේ. නව සංචාරක නිෂ්පාදන සමග වැඩිදියුණු කළ වටිනාකම් දාමයක්, ගමනාන්ත අලෙවිකරණය, නිපුණතා සංවර්ධනය සහ වඩාත් වැදගත් කරුණක් වන දිස්ත්‍රික්කය තුළ සංචාරකයින්ගේ ගමනාගමනය ඵලදායි ලෙස කළමනාකරණය කිරීම පශ්චාත් අර්බුදකාරී තත්වයන්ට මුහුණ දුන් ව්‍යාපාර ප්‍රකෘතිමත් වීමේ කාල සීමාව තුළ, සංචාරක ව්‍යාපාරයේ පවතින සහ වර්ධනය වීමට ඉඩ ඇති ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාවෙහි අඩු වැඩි වීම සඳහා අදාළ දිස්ත්‍රික්කයට ඉතා වැදගත් වේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ නිපුණතා සංවර්ධනය පිළිබඳව රාජ්‍ය අංශයේ පුහුණු සපයන්නන් විසින් ආධිපත්‍යය දරන අතර ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM - 68%) විසින් එහි ප්‍රධාන ස්තානය ගනු ලබන අතර ඉතිරි කොටස VTA (19%), NAITA (6%) , යුනිවර්සිටි කොලේජ් (4%) සහ ශ්‍රී ලංකා යොවුන් (2%) සතු වේ. වාර්ෂිකව පුහුණු කරනු ලබන ප්‍රමාණය 275 ක් පමණ වන අතර, ඉවුම් පිහුම් පිළිබඳ පාඨමාලාව ඉන් වඩාත් ජනප්‍රිය වන අතර එය සමස්ත සිසුන් බඳවා ගැනීම් වලින් 31% ක් වේ. ඉහළ ඉල්ලුමක් ඇති වැඩසටහන් අතරට ආපනශාලා සහ බාර් සේවාව, පේස්ට්‍රි සහ බේකරි, ආහාර පාන, සහ ගෘහ පාලනය ද ඇතුළත් වේ. සංචාරක අංශයේ නිපුණතා සංවර්ධනය සඳහා කාන්තා සහභාගීත්වය 2019 වසරේ 12% ක් වූ අතර එය 2021 දී 23% දක්වා ඉහළ ගොස් ඇත.

සංචාරක කර්මාන්තයට අදාළ වටිනාකම් දාමයේ නිපුණතා හිඩැස් තොරතුරු තාක්ෂණවේදය, තාක්ෂණික සහ ව්‍යාපාරික කුසලතාවන්හි සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතී. පරිමාණයක් ලෙස බලන විට, නිපුණතා හිඟය ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ සමාගම්වලට සාපේක්ෂව මධ්‍යම පරිමාණ සමාගම්වල වැඩිය. රැකියා කාණ්ඩය අනුව, පුරවා නොමැති පුරප්පාඩුවල ඉහළම අනුපාතය ප්‍රධාන රැකියා කණ්ඩායම් දෙකක් වන කුක් (23%) සහ වේටර් (16%) යන රැකියා කාණ්ඩ වලින් වාර්තා වේ. ව්‍යාපාර වර්ගය අනුව, ආපනශාලා (20%), හෝටල් (12%) සහ බංගලා / නිවාඩු නිකේතන (10%) යන උප අංශවල පුරවා නැති පුරප්පාඩු ප්‍රමාණය වැඩිය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිපුණතා සංවර්ධනය, ඉල්ලුම සහ සැපයුම යන අංශ දෙකේදීම සීමා වී ඇත.

මෙම අභියෝග මධ්‍යයේ වුවද නිපුණතා සංවර්ධනය තුළින් සංචාරක ව්‍යාපාරයේ වර්ධනයට සහ සංවර්ධනයට අනුරාධපුර දිස්ත්‍රික්කයට අවස්ථා රාශියක් තිබේ. අනුරාධපුරය එහි ස්වභාවික හා සංස්කෘතික සම්පත්වලින් පොහොසත් හා තරඟකාරී වන නමුත් සංචාරක අංශයේ කුසලතා සංවර්ධනය, ගමනාන්ත සංවර්ධනය, නවීන තාක්ෂණයේ යෙදීම් සහ ආයතනික ආධාරක පද්ධති යන අංශ වලින් එහි තරඟකාරීත්වය අඩුය.

නිපුණතා සංවර්ධනය හරහා සංචාරක ව්‍යාපාරයේ තිරසාර ව්‍යාපාර ප්‍රකෘතිමත් කිරීම පිළිබඳ පාර්ශවකරුවන් විශාල ප්‍රමාණයක් සමඟ කළ උපදේශන උපාය මාර්ග 8ක් සහ මැදිහත්වීම් 12ක් යටතේ ව්‍යුහගත ක්‍රියාකාරී වැඩසටහන් 16ක් හඳුනා ගැනීමට හැකි විය. සෑම ක්‍රියාවකටම කාල රාමුවක් ඇති අතර ක්‍රියාවේ ස්වභාවය සහ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ ඇති විය හැකි හවුල්කාරිත්වය සැලකිල්ලට ගනිමින් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන හඳුනා ගැනීම සිදු කරයි. සංචාරක වටිනාකම් දාමයේ ඇති ප්‍රධාන කුසලතා හිඩැස් පිළිබඳව ක්‍රියාකාරී

වැඩසටහන් මගින් විශේෂ අවධානයක් යොමු කරන අතර ක්ෂණික ක්‍රියාමාර්ග සඳහා පහත ක්‍රියාකාරකම් යෝජනා කරයි.

a) ඩිජිටල් අලෙවිකරණ කුසලතා වැඩි දියුණු කිරීම

b) ඉවුම් පිහුම්, බේකරි කුසලතා සහ සංචාරක මාර්ගෝපදේශනය පිළිබඳ කුසලතා වැඩිදියුණු කිරීම

c) මූලික ආගන්තුක සත්කාර කුසලතා පිළිබඳ ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම

d) සේවා ස්ථානය පදනම් කරගත් බහුකාර්ය කුසලතා සංවර්ධනය.

e) ව්‍යාපාර පුහුණු සහාය ලබා දීම, සහ

f) නිපුණතා සංවර්ධනය සඳහා උප ජාතික මට්ටමේ කාර්ය මණ්ඩලයේ ධාරිතාව ගොඩනැගීම.

# 1 වන පරිච්ඡේදය

## හැඳින්වීම



## 1.1 හැඳින්වීම

අනුරාධපුරය යනු විදේශීය සහ දේශීය අමුත්තන් අතර වඩාත් ජනප්‍රිය සංචාරක ගමනාන්තයන්ගෙන් එකකි. එය ස්වභාවික, ඓතිහාසික සහ සංස්කෘතික වත්කම් වැනි සංචාරක වත්කම්වලින් ආශිර්වාද ලත් දිස්ත්‍රික්කයකි. දිස්ත්‍රික්කයේ ආර්ථික ප්‍රසාරණයට සහ රැකියා උත්පාදනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට සංචාරක කර්මාන්තයට හැකියාව ඇත. වසංගතය මගින් බාහිර කම්පනයන් හමුවේ අනුවර්තනය වීමේ සහ ධෛර්යයේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කර ඇත. සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නය මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයට දැනට පවතින ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට සහ සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛතම ගමනාන්තයක් බවට පත්වීමට අවස්ථාව උදාවී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ MSMEs සඳහා වඩාත් ඔරොත්තු දෙන, අන්තර් සහ තිරසාර සංවර්ධන මාර්ග හරහා සංචාරක ව්‍යාපාරයට දායක වීමට හැකි වන ආකාරයේ ඒකාබද්ධ ප්‍රයත්නයක් දැරීමට සහ ක්‍රියාකාරී වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීමට සුවිශේෂී අවස්ථාවක් දැන් ඇති වී තිබේ .

උතුරු මැද පළාතේ පිහිටා ඇති, ශ්‍රී ලංකාවේ විශාලතම දිස්ත්‍රික්කය අනුරාධපුර දිස්ත්‍රික්කය වන අතර, අනුරාධපුර නගරය පළාතේ පරිපාලන මධ්‍යස්ථානය වේ (ඇමුණුම 1). ජල කඳන් හැරුණු විට දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 7,179 කි. අභ්‍යන්තර ජල මූලාශ්‍රවල මුළු වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් 515ක් පමණ වේ. දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 කින් සමන්විත වන අතර ඒවා තවදුරටත් ග්‍රාම නිලධාරී වසම් 694 සහ ගම් 2633 කට බෙදා ඇත. දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන මහ නගර සභාවකින් සහ ප්‍රාදේශීය සභා දහඅටකින් සමන්විත වේ.

ඓතිහාසික වශයෙන් ක්‍රි.පූ. 5 වැනි සියවස දක්වා දිවෙන "රජරට" නමින් හඳුන්වනු ලැබූ පුරාණ ලෝකයේ ශ්‍රේෂ්ඨතම පැවිදි නගරය වන අනුරාධපුරය ක්‍රිස්තු වර්ෂ 11 වැනි සියවස දක්වා ශ්‍රී ලංකා රාජ්‍යයේ ප්‍රතාපවත් ආසනය ලෙස පැවතුණ අතර, තම්බපණ්ණි සහ උපතිස්ස නුවර රාජධානි වලින් පසුව අනුරාධපුරය බොහෝ කලක් ජනාවාස ව තිබී ඇත. අනුරාධපුරය යනු ශ්‍රී ලංකාවේ ප්‍රථම සැලසුම්ගත නගරය වන අතර දැවැන්ත බෞද්ධ සිද්ධස්ථාන හා ආශ්‍රම, විචිත්‍රවත් මාලිගා, මණ්ඩප සහ උද්‍යානවල නටබුන්, දියුණු පැරණි ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර, මූර්ති සහ ඉංජිනේරු විද්‍යාව සඳහා සාක්ෂි සපයන නාන පොකුණු සහ විශාල ජලාශ සහිත පළමු ඓතිහාසික අගනුවර ද එය විය. එය හයිඩ්‍රොලික ශිෂ්ටාචාරයේ තොටිල්ල වන අතර ථෙරවාදී බුදු දහමේ මධ්‍යස්ථානයයි. භූමිය පුරා විසිරී ඇති නටබුන් එහි පුරාවිද්‍යාත්මක, ඓතිහාසික සහ ආගමික වැදගත්කම නිසා දේශීය හා විදේශීය සංචාරකයින්ට එය සිත් ඇදගන්නාසුළු පරිසරයක් බවට පත් කරයි.

වර්තමානයේ, නගරය පැහැදිලිවම "පූජනීය නගරය" සහ "නව නගරය" ලෙස හඳුනාගත හැකි ප්‍රදේශ දෙකකට වෙන් කර ඇත. "ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ" හෙවත් තවමත් ජීවමාන, ලේඛනගත, රෝපණය කරන ලද ලොව පැරණිතම වෘක්ෂය, ස්වර්ණමාලි ස්ථූපය, සමාධි ප්‍රතිමාව ඇතුළු වැදගත් පුරාවිද්‍යාත්මක, ඓතිහාසික හා ආගමික ස්ථාන කිහිපයක් තවමත් මෙම පූජනීය නගරය තුළ පිහිටා ඇත. මීට අමතරව, දිස්ත්‍රික්කය පුරා වැදගත් පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, ආගමික සහ වෙනත් සංචාරක ආකර්ෂණ ස්ථාන රාශියක් ද ඇත (ඇමුණුම 1).

දිස්ත්‍රික්යෙහි අගනුවර වන අනුරාධපුරය කොළඹ සිට කිලෝමීටර් 212 ක් දුරින් පිහිටා ඇති අතර එය එහි මාර්ග සහ දුම්රිය ජාලය හරහා රටේ අනෙකුත් ප්‍රදේශවලට ඉතා හොඳින් සම්බන්ධ වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 න් 11ක අවම වශයෙන් එක් දුම්රිය ස්ථානයක්වත් පිහිටා ඇත. කොළඹ සිට කුලී රථයකින් යාමට පැය 4කට ආසන්න කාලයක් ගත වෙන නමුත් දිස්ත්‍රික්කයේ සමහර දුරස්ථ ප්‍රදේශවලට පොදු ප්‍රවාහන පහසුකම් ඉතා දුර්වල මට්ටමක පවතී. දිස්ත්‍රික් GND ග්‍රාම නිළධාරී සංඛ්‍යාලේඛනවලට අනුව, පොදු ප්‍රවාහනයේ ආරම්භක ස්ථාන සහ ගමනාන්ත වෙත ප්‍රවේශ වීමට ඇති අවම දුර ප්‍රමාණය ග්‍රාම නිළධාරී කොට්ඨාශ 694න් 448 කම 5 km හෝ ඊට වඩා වැඩි වේ. අනෙකුත් යටිතල පහසුකම්, ජල සැපයුම, සනීපාරක්ෂාව, විදුලිය සහ සන්නිවේදන පහසුකම් බොහෝ දුරට නාගරික ප්‍රදේශවලට පමණක් සීමා වී ඇති අතර දුරස්ථ ප්‍රදේශවල මෙම පහසුකම් ඉතා හිඟ වේ. නිදසුනක් වශයෙන්, ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවහන මණ්ඩලයෙන් හෝ ප්‍රජා මූලික සංවිධානවලින් සපයන ලද නළ ජලය ග්‍රාම නිලධාරී වසම් 484ක් (69.7%) තුළ පවතී. ග්‍රාම නිළධාරී කොට්ඨාශ 197 ක තැපැල් කාර්යාල/උප තැපැල් කාර්යාල/ නියෝජිත තැපැල් කාර්යාල ඇති අතර, සන්නිවේදන පහසුකම් සැපයීම සඳහා ග්‍රාම නිළධාරී කොට්ඨාශ 22ක "විදාතා සහ නැණසළ මධ්‍යස්ථාන පිහිටා තිබේ. සන්නිවේදන මධ්‍යස්ථාන සහිත ග්‍රාම නිළධාරී කොට්ඨාශ 134ක් ද දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

සංචාරක ව්‍යාපාරය ජාතික හා උප ජාතික මට්ටමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය යතා තත්වයට පත් කිරීම සඳහා ප්‍රධාන දායකත්වයක් සපයයි. දිස්ත්‍රික් මට්ටමින් විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයට සංචාරක වටිනාකම් දාමයේ ක්‍රියාත්මක වන වීථි හරහා කලාපීය ආර්ථිකයේ පුළුල් හරස්කඩකට ආදායම් සහ රැකියා අවස්ථා උත්පාදනය කිරීමේ හැකියාව ඇත. පූර්ව කොවිඩ් කාලය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ඉල්ලුම විදේශීය අමුත්තන් විසින් මසකට අමුත්තන්ගේ රාත්‍රී 19,000 ක් සහ දේශීය අමුත්තන් විසින් රාත්‍රීන් 6000 ක් පමණ වනු ඇතැයි ගණන් බලා ඇත. මෙය අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාපීය ආර්ථිකයට සංචාරක ක්ෂේත්‍රයෙන් ඇති දායකත්වය මනාව පෙන්නුම් කරයි. වඩාත් නිශ්චිතව පැවසුවහොත්, දිස්ත්‍රික්කයේ ආර්ථික ක්‍රියාකාරකම් නංවාලීම සඳහා සංචාරක අංශයේ වීථි හරහා රැකියා සහ ආදායම් උත්පාදනයේ බහුවිධ බලපෑම් ඉතා වැදගත් වේ.

## 1.2 පසුබිම

අන්තර් වර්ධනය සඳහා වන කුසලතා (S4IG) වැඩසටහන ඕස්ට්‍රේලියානු රජයේ ආධාර වැඩසටහන මූලිකත්වයෙන් ආරම්භ කරන ලද්දක් වන අතර එය ඕස්ට්‍රේලියානු විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව (DFAT) නියෝජනය කරමින් පැලේඩියම් විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේ නිපුණතා සංවර්ධනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන, සංචාරක අධිකාරීන්, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ පරිපාලන ආයතන සහ කර්මාන්ත සහ ප්‍රජා සංවිධාන යන සියල්ල සමඟ සහයෝගීතාවයෙනි.මෙම වැඩසටහන හරහා නිපුණතා සංවර්ධනය කිරීම පිණිස සිදු කරන ඒකාබද්ධ ප්‍රවේශයක් මගින් ශ්‍රී ලංකාවේ සංචාරක වටිනාකම් දාමයේ ව්‍යාපාරික කාර්ය සාධනය වැඩිදියුණු කරනු ඇත. මෙම සන්දර්භය තුළ, තිරසාර රැකියා උත්පාදනයට සහය වනු ඇති අතර, විවිධ අවාසි සහගත තත්ව වලට මුහුණ දුන් සහ ආබාධ සහිත පුද්ගලයින් සහ කාන්තාවන් ඇතුළු ආන්තික කණ්ඩායම්වල ආදායම වැඩි දියුණු කරයි. කලාපීය සහ දිස්ත්‍රික් මට්ටමින් නිපුණතා සංවර්ධන සැලසුම් කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම, අන්තර් ආයතනික සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම, කුසලතා-නොගැලපීම් අවම කිරීම සහ කුසලතා සඳහා ඉල්ලුම උත්පාදනය කිරීම එමගින් අපේක්ෂා කෙරේ. තවද, අවිධිමත් අංශය වඩාත් විධිමත් ක්ෂේත්‍රයක් වෙත යොමු කිරීමටත්, සංචාරක වටිනාකම් දාමයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීමටත්, ඉක්මනින් ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමක් සහ කලාපීය සංවර්ධනය කිරීමකට මඟ පාදන උපාය මාර්ග මෙහිදී අනුගමනය කරනු ඇත.

## 1.3 අරමුණු

අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා වන නිපුණතා උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්මේ (SSAP) සමස්ත අරමුණ වන්නේ තිරසාර, ව්‍යවසායක සහ නව්‍ය සංස්කෘතියක් නිර්මාණය කිරීමට හැකිවන ලෙස පුද්ගලයන්ට සහ සේවා යෝජකයන්ට කුසලතා සහ ඉගෙනුම් පළපුරුද්ද ලබාදීම මගින් කලාපීය ආර්ථිකයෙහි, 2022න් පසු ආර්ථික පුනරුත්ථාපන කාලය තුළ සංචාරක කර්මාන්තයේ නැගී එන අභියෝග වලට මුහුණ දීමට හැකි අන්තර් වර්ධනයක් ප්‍රවර්ධනය කිරීමයි.

වඩාත් නිශ්චිත අරමුණු වන්නේ

- සංචාරක වටිනාකම් දාමයට අදාළ ව්‍යාපාර වර්ධනය කිරීමට සහයෝගය දීමට හැකි අයුරින් පුහුණු සැපයුම් ජාලයෙන් ලබා ගත හැකි සේවාවන් පිළිබඳ දළ විශ්ලේෂණයක් සැපයීම.
- සංචාරක වටිනාකම් දාමය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නිපුණතා සංවර්ධනය කිරීමේදී මුහුණ දීමට සිදුවන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම.
- අන්තර් වර්ධනය තුළින් සංචාරක අංශයේ කුසලතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන මැදිහත්වීම් සමඟ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම.
- රැකියා වලින් පොහොසත් වර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ව්‍යාපාර ප්‍රකෘතිමත් කිරීමට සහ වඩාත් වැඩියෙන් අන්තර් වර්ධන මාවතකට සහාය වන ආකාරයේ නිර්දේශ යෝජනා කිරීම.

## 1.4 SSAP සංවර්ධනය සඳහා භාවිතා කරන ප්‍රවේශය.

SSAP සඳහා වන විශ්ලේෂණය ජාතික සහ උප ජාතික මට්ටමින් සංචාරක කර්මාන්තයේ වර්ධන කාර්ය සාධනය සහ නිපුණතා සංවර්ධනය පිළිබඳ දැනට පවතින දත්ත සහ පර්යේෂණ සාක්ෂි මත පදනම් වේ. ප්‍රතිපත්ති මාර්ගෝපදේශ අනුව, එය ප්‍රතිපත්ති ලේඛන අටක් මගින් මෙහෙයවනු ලැබේ.

**ජාතික මට්ටමේ**

- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2021-2024
- 2022-2025 ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සඳහා උපාය මාර්ගික සැලැස්ම
- ශ්‍රී ලංකා සංචාරක දැක්ම 2025
- ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය (2022 අගෝස්තු)
- **TVET** අංශය සඳහා ජාතික සංවර්ධන සැලැස්ම (2023-2027), කෙටුම්පත

**උප ජාතික මට්ටම**

- පස් අවුරුදු සංවර්ධන සැලැස්ම අනුරාධපුර දිස්ත්‍රික්කය 2018-2022
- අනුරාධපුර නාගරික සංවර්ධන සැලැස්ම 2019-2030
- අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

මෙම ප්‍රවේශය ව්‍යාපාර හිමිකරුවන්, පුහුණු සපයන්නන්, සංචාරක වටිනාකම් දාමයේ සේවකයින් සහ ජාතික සහ උප ජාතික මට්ටම්වල ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පරිපාලකයින් වැනි ප්‍රධාන පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් වල පුළුල් උපදේශන මත ද පදනම් වේ. විශ්ලේෂණාත්මක ක්‍රමවේදය මෙහෙයවනු ලබන්නේ ශ්‍රම වෙළඳපොළ සමතුලිතතාවය, අන්තර් වර්ධනය සහ නිපුණතා සංවර්ධනය, පශ්චාත්-අර්බුද ව්‍යාපාර ප්‍රකෘතිමත් කිරීම පිළිබඳ ආනුභාවික සාක්ෂි පිළිබඳව ඇති ආර්ථික ආකෘති මගිනි. මෙම ඇගයීම මගින් දිස්ත්‍රික් මට්ටමින් සංචාරක කර්මාන්තයේ තත්ත්වය, නිපුණතා සංවර්ධන තත්ත්වය, නිපුණතා සංවර්ධනය තුළින් ව්‍යාපාර ප්‍රතිසාධනය සඳහා උපාය මාර්ගික විකල්පයන් යන කරුණු ආවරණය කෙරේ. අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා සකස් කරන ලද SSAP සංචාරක අංශයේ MSME ව්‍යාපාර ප්‍රකෘතිමත් කිරීම කෙරෙහි පැහැදිලි අවධානයක් යොමු කරමින් සංචාරක කර්මාන්තයේ නිපුණතා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නිශ්චිත ක්‍රියාමාර්ග සපයයි.

## 1.5 SSAP හි දළ විශ්ලේෂණය

මීළඟ පරිච්ඡේදය (02 වන පරිච්ඡේදය) මගින් ජාතික සහ දිස්ත්‍රික් මට්ටමින් සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනයට ඇති ඉඩකඩ සහ උපාය මාර්ගික දිශානතිය පිළිබඳව ඉදිරිපත් කරයි. දැක්ම සහ මෙහෙවර ඇතුළුව නිපුණතා සංවර්ධනය සඳහා වන අභියෝග, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම 03 වන පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇත. අවසාන පරිච්ඡේදය ප්‍රධාන වශයෙන් SSAP හි සාරාංශය ද සමඟ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය කෙරෙහි අවධානය යොමු කරයි.

# 2 වන පරිච්ඡේදය

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ සංවර්ධනයට ඇති අවස්ථා සහ උපාය මාර්ගික දිශානතිය



## 2.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදය මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයේ වත්මන් තත්ත්වය, මහා පරිමාණ ආර්ථිකය, කලාපීය ආර්ථිකය, දිස්ත්‍රික්කයේ සංචාරක ක්ෂේත්‍රයේ තත්ත්වය, නිපුණතා හිඩැස්, සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ ආයතනික ආධාරක පද්ධතිය කෙරෙහි අවධානය යොමු කරයි. මෙම පදනම් තොරතුරු දිස්ත්‍රික්කයේ සංචාරක ක්ෂේත්‍රයේ නිපුණතා සංවර්ධනය සඳහා උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සැකසීම සඳහා පදනම ලෙස ක්‍රියා කරයි.

## 2.2 මහා පරිමාණ ආර්ථිකය

මේ වන විට ශ්‍රී ලංකාව සිටින්නේ නිදහසින් පසු ඉතිහාසයේ මුහුණ දීමට සිදු වූ තීරණාත්මක සන්ධිස්ථානයක ය. වසර ගණනාවක වැරදි ආර්ථික කළමනාකරණය, දුර්වල පාලනය, දුර්වල ප්‍රතිපත්ති තේරීම් සහ COVID-19 වසංගතය සහ රුසියානු-යුක්රේන යුද්ධය වැනි බාහිර කම්පනවල බලපෑම්, 2022 දී රට එහි දරුණුතම අර්බුදයට ඇද දැමීය. ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ එය එකම සෘණ අතට වර්ධනය වන රට වන අතර එහි ආර්ථිකය කඩාවැටීම සහ දේශපාලන අස්ථාවරත්වය, මේ වන විට දුප්පත්ම සහ වඩාත්ම අවදානමට ලක්වීමට ඉඩ කඩ ඇති මිනිසුන් කාණ්ඩයට දැඩි පහරක් එල්ල කරමින්, ජීවිත සහ ජීවනෝපායන් විනාශ කර ඇත. 2022 වසරේ ආර්ථික වර්ධනය -7.8% ක් වූ අතර උප අංශ මට්ටමින් එම වසරේම කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා අංශයේ වර්ධනය පිළිවෙලින් 4.6%, 16% සහ 2% විය. 2023, 2024 සහ 2025 සඳහා ප්‍රක්ෂේපිත ආර්ථික වර්ධනය අසල්වැසි රටවල ආර්ථිකයන් සඳහා පිළියෙළ කරන ලද වර්ධන ප්‍රක්ෂේපන 5 ක් සමග සන්සන්දනය කර බැලූ විට පිළිවෙළින් 3%, 1.5% සහ 2.6% වේ. විදේශ ණය ජාතික ආදායමෙන් 75% ඉක්මවන අතර ජාතික ඉතුරුම්-ආයෝජන ශේෂය සෘණ අගයක් ගනී. 2021 සහ 2022 අතර ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය දෙගුණයකට ආසන්නව, 13% සිට 25% දක්වා ඉහළ ගොස් ඇති අතර (එක් පුද්ගලයෙකුට දිනකට ඩොලර් 3.65 දරිද්‍රතා රේඛාව මත පදනම්ව), සහ 2023 දී එය තවත් ප්‍රතිශත ලක්ෂ 2 කින් වැඩි වනු ඇතැයි පුරෝකථනය කර ඇත. නාගරික අංශයේ දරිද්‍රතාවය 5% සිට 15% දක්වා තුන් ගුණයකින් වැඩි විය. හොඳ රැකියාවක් සඳහා ඇති අපේක්ෂාවන් සීමා වී ඇති, ආදායම් පහත වැටී සහ උද්ධමනය මගින් බාදනය වී ඇති, යහපත් අනාගතයක් සඳහා අවස්ථා වඩ වඩාත් දුර්ලභ වෙමින් පවතින නව යථාර්ථයකට ඉක්මනින් හැඩගැසීමට ශ්‍රී ලංකාවේ ජනතාවට දැඩි ලෙස බලපෑම් කෙරී ඇත. අර්බුධයේ බරපතලකම ශ්‍රී ලංකාවට නව සංවර්ධන ආකෘතියක් අවශ්‍ය බව පැහැදිලි කර ඇති අතර සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ නව සංවර්ධන ආකෘතියේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ හැකි ප්‍රධාන අංශයක් බව පෙනේ. එය මගින් 2021 දී 1.7% ක වර්ධනයට සාපේක්ෂව 2022 දී 27% ක ඉහළම වර්ධන වේගය වාර්තා කරන ලදි. 2023 පළමු කාර්තුවේ සංචාරක පැමිණීම්වල අඛණ්ඩ වර්ධනයත් සමඟ වර්ධන වේගය වසර පුරා දිගටම පැවතිය හැකිය.


## 2.3 කලාපීය ආර්ථිකය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 957,000 ක් වන අතර එය රටේ මුළු ජනගහනයෙන් 4.3% කි. 2022 දී දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 957,000 ක් වූ අතර පිරිමින් 467,000 ක් සහ කාන්තාවන් 490,000 ක් විය . අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඒක පුද්ගල ආදායම (PCI) රු 777556 වූ අතර 2022 වසරේ එය ජාතික ඒක පුද්ගල ආදායම් මට්ටමට 28% වඩා අඩු විය. 2019 වසරේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ දරිද්‍රතා මට්ටම 8.1% (HCR) වූ අතර එය ජාතික මට්ටමට 14.3% වඩා බෙහෙවින් අඩු විය. COVID-19 සහ ආර්ථික අර්බුධයේ බලපෑමත් සමඟ මෙය 16% දක්වා ඉහළ ගොස් ඇත. COVID-19 වසන්ගතයට පෙර අනුරාධපුරයේ මුළු විදේශීය අමුත්තන්ගේ රාත්‍රීන් සංඛ්‍යාව වසරකට 227676 ක් වූ අතර එය 2021 දී 2000 දක්වා අඩු විය. දේශීය අමුත්තන්ගේ ඉල්ලුම 2018 දී අමුත්තන්ගේ රාත්‍රී 67763 ක් පමණ වූ අතර අනුරාධපුර කලාපයේ විදේශීය සහ දේශීය අමුත්තන්ගේ රාත්‍රීන් දෙකෙහිම සාපේක්ෂ වෙළෙඳපොළ කොටස එම කාලය තුළ පිළිවෙළින් 2% ක් සහ 3.5% ක් විය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ රැකියා ව්‍යුහය ජාතික මට්ටමේ ව්‍යුහාත්මක ලක්ෂණ අනුගමනය නොකරයි. පළමුව, එහි සේවා නියුක්තිය, ප්‍රධාන කර්මාන්ත කාණ්ඩය වන කෘෂිකාර්මික අංශය දෙසට බෙහෙවින් නැඹුරු වී ඇති අතර (51.9% කින්) එය ජාතික සාමාන්‍යය වන 26.5%

ට සාපේක්ෂව (රූපය 2.1) ඉතා ඉහළ අගයක් ගනී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සාපේක්ෂව අනුරාධපුරයේ කර්මාන්ත හා සේවා අංශවල කොටස් ජාතික සාමාන්‍යයට වඩා සැලකිය යුතු ලෙස අඩුය. ග්‍රාම නිළධාරී කොට්ඨාශ 694න් 637ක් (91.8%) භෝග නිෂ්පාදනයට සම්බන්ධ වී ඇති අතර ග්‍රාම නිළධාරී කොට්ඨාශ වලින් 45%ක් පශු සම්පත් වලටද, ග්‍රාම නිළධාරී කොට්ඨාශ වලින් 31% ක ජනතාව කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතුවලද, 11%ක් ධීවර කර්මාන්තවලද නිරත වේ. දෙවනුව, මෙම දිස්ත්‍රික්කයේ ශ්‍රම බලකාය සඳහා පිරිමි සහ කාන්තා ශ්‍රමිකයින්ගේ සහභාගීත්ව අනුපාතය එහිම ජාතික සාමාන්‍යයට වඩා වැඩි වේ (වගුව 2.1). තෙවනුව, අනුරාධපුරයේ අවිධිමත් අංශයේ රැකියා වල නියුතු කොටස 72%ක් වන අතර එය ජාතික සාමාන්‍යය වන 58.4% ට වඩා සැලකිය යුතු ලෙස වැඩි ය. නිදසුනක් වශයෙන්, ජාතික කොටස වන 33.4% ට සාපේක්ෂව ස්වයං රැකියාවල නියුතු කොටස 44.9% කි. ඒ හා සමානව, ජාතික මට්ටමේ 57.3% ට සාපේක්ෂව රැකියාවල නියුතු වන සේවක කොටස 38.6% කි. මෙයින් අදහස් කරන්නේ ස්වයං රැකියා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන රැකියා මූලාශ්‍රයක් වන බව සහ එය පශ්චාත් අර්බුදකාරී කාල සීමාව තුළ දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා ධනාත්මක සලකුණක් වන බවයි. කෙසේ වෙතත් එක් වැදගත් කරුණක් වන්නේ ජාතික සාමාන්‍යය 2.5%ට සාපේක්ෂව අනුරාධපුරයේ ඌන රැකියා අනුපාතය 4.2% වැනි ඉහළ මට්ටමක පැවතීමයි.

**රූපය 2.1 අනුරාධපුර දිස්තික්කයේ රැකියා ව්‍යුහය -2022 %**




මූලාශ්‍රය: DCS, 2023 (2022 LF බුලටින්)

**වගුව 2.1 : අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශ්‍රම බලකා තත්ත්වය 2021**

| අයිතමය | ඒකකය | අනුරාධපුර | ශ්‍රී ලංකාව |
|---|---|---|---|
| සම්පූර්ණ ශ්‍රම බලකාය - ස්ත්‍රි පුරුෂ දෙපාර්ශවය | අංක | 385,256 කි | 8,553,290 |
| ශ්‍රම බලකාය - පිරිමි | % | 62 | 65.7 |
| ශ්‍රම බලකාය - ගැහැණු | % | 38 | 34.3 |
| ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය - ස්ත්‍රි පුරුෂ දෙපාර්ශවය | % | 55.6 | 49.9 |
| ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය - පිරිමි | % | 75.8 | 71 |
| ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය - කාන්තාවන් | % | 38.8 | 31.8 |
| රැකියාව - ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම | % | 95.4 | 94.9 |
| රැකියා විරහිත - ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම | % | 4.6 | 5.1 |
| නුසුදුසු රැකියා - ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම | % | 4.2 | 2.5 |
| අවිධිමත් අංශයේ රැකියා - ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම | % | 72 | 58.4 |
| අවිධිමත් අංශයේ රැකියා - කෘෂි නොවන. අංශය | % | 45.2 | 47 |
| සාක්ෂරතා අනුපාතය - ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම | % | 93.6 | 93.3 |

මූලාශ්‍රය: DCS, 2022. QLF 2021.

## 2.4 අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශය

අනුරාධපුරය ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සඳහා ප්‍රමුඛ ස්ථානයක් ලෙස නම් කර ඇත. එය ස්වභාවික, ඓතිහාසික සහ සංස්කෘතික වත්කම් වැනි විවිධ සංචාරක වත්කම්වලින් ආශිර්වාද ලත් ස්ථානයකි. ඒවායින් බොහොමයකට ඓතිහාසික, ආගමික හෝ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති බැවින් දේශීය සංචාරකයින් අතර විශාල වශයෙන් ජනප්‍රිය වේ. මීට අමතරව, විල්පත්තු ජාතික වනෝද්‍යානය සහ පුරාණ වාරිමාර්ග ආශ්‍රිත සමහර යෝධ වැව් දිස්ත්‍රික්කයට සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වේ. මීට අමතරව, සංචාරක ව්‍යාපාරයෙහි වර්ධන හැකියාව පෙන්නුම් කරමින් මුළු දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි සංචාරක ගමනාන්ත කිහිපයක් පිහිටා තිබේ. දඹුල්ල, සීගිරිය, මින්නේරිය ජාතික වනෝද්‍යානය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය සහ දිවයිනේ උතුරු ප්‍රදේශය වැනි ප්‍රසිද්ධ සංචාරක ගමනාන්ත වෙත විකාශනය වී ඇති මාර්ග සහ දුම්රිය ජාලය ද අනුරාධපුර දිස්ත්‍රික්කයට වැඩි වශයෙන් සංචාරකයින් පැමිණීමට උපකාරී වන එක් සාධකයකි. විශේෂයෙන්ම දේශීය සංචාරකයින් විශාල වශයෙන් ආකර්ෂණය කර ගැනීමට දිස්ත්‍රික්කයේ ආගමික සිද්ධස්ථාන පාදක කරගෙන පවත්වන අවස්ථා සහ සිදුවීම් බෙහෙවින් උපකාරී වේ. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් විදේශීය අමුත්තන් සඳහා දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරයට ඇති ඉඩකඩ සහ හැකියාව සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන නොමැත. දිස්ත්‍රික්කයේ පවතින පරිසර හිතකාමී පරිසරය සහ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ප්‍රජා සංචාරක ව්‍යාපාරය දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට ඇති නව මාවත් වේ. නිදසුනක් වශයෙන්, අනුරාධපුරයේ ග්‍රාමීය ප්‍රදේශවල කෘෂි සංචාරක ව්‍යාපාරයේ වර්ධනය මඟින් ප්‍රාදේශීය ප්‍රජාවන්ට සැලකිය යුතු අවස්ථාවන් ලබා දිය හැකි නමුත්, එහි සම්පූර්ණ විභවය සාක්ෂාත් කර ගැනීමට දිස්ත්‍රික් බලධාරීන්ගේ සහාය අවශ්‍ය වේ. කෘෂිකාර්මික ක්‍රියාකාරකම් නැරඹීම සහ ඒවාට සහභාගී වීම වටා නිර්මාණය වූ නැගී එන සංචාරක ව්‍යාපාර අංශයක් වන කෘෂි සංචාරක ව්‍යාපාරය ලොව පුරා වර්ධනය වන ප්‍රවණතාවකි. ඒ හා සමානව, සුවතා සංචාරක ව්‍යාපාරය විදේශීය අමුත්තන් ආකර්ෂණය කර ගැනීමට සහ ආදායම් උත්පාදනය කිරීමට එහි ඇති විශේෂ හැකියාව නිසා දිස්ත්‍රික්කය සඳහා සුවිශේෂී වෙළඳපොළක් ලෙස සැලකිය හැකිය.

පූර්ව කොවිඩ් කාලපරිච්ඡේදය තුළ දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ සංවර්ධනයට සහාය වීම සඳහා සැලකිය යුතු ආයෝජනයක් සිදු කර තිබේ. 2017-2019 කාලය තුළ නාගරික සංවර්ධන අධිකාරිය විසින් විනෝදාස්වාද පහසුකම් වැඩිදියුණු කිරීම්, නගර මධ්‍යස්ථාන සංවර්ධනය

යනාදිය ඇතුළු විවිධ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 450ක් වැය කර ඇත. එමෙන්ම නවාතැන්දීමේ ධාරිතාව (කාමර ගණන) 2021 දී 1619 දක්වා ළඟා විය.

විවිධ උප අංශ 12ක් නියෝජනය කරමින් 2021 වසරේ සංචාරක වටිනාකම් දාමයේ මුළු සේවක සංඛ්‍යාව 1751ක් විය. මෙම සේවා මිශ්‍රණයෙන්, සංචාරක වටිනාකම් දාමයේ උප අංශ හතරක් වන නිවෙස් ආශ්‍රිත නවාතැන් පහසුකම් සැපයීම, ආපනශාලා, ප්‍රවාහන සේවා සහ සංස්කෘතික සේවා සැපයීම මගින්, සේවා නියුක්තියෙන් 46%ක් නියෝජනය වේ. රැකියා තත්ත්වය අනුව, සංචාරක වටිනාකම් දාමයේ සේවය කරන බහුතරයක් ස්ථිර සේවකයින් (73%) වන අතර ඉතිරිය තාවකාලික/අනියම් සේවකයින් ලෙස සේවය කරයි. සංචාරක වටිනාකම් දාමයේ කාන්තාවන්ගේ සහභාගීත්වය, ප්‍රවාහන සේවාවන්හි 12% සිට ස්පා,සුවතා මධ්‍යස්ථාන සහ රූපලාවන්‍යාගාරවල 78% දක්වා වෙනස් වේ (වගුව 2.2). සංචාරක අංශයේ රැකියා වල නියුතු ආබාධිත පුද්ගලයින්ගේ කොටස 1% කි. නිපුණතා මිශ්‍රණය සම්බන්ධයෙන් ගත් කල, සේවකයින්ගෙන් 64% ක් පුහුණු ශ්‍රමිකයන් වන අතර ඉතිරිය මධ්‍යම පුහුණු (23%) සහ අඩු නිපුණතා කාණ්ඩවලට (13%) අයත් වේ. 2019 සහ 2021 අතර, විශේෂයෙන්ම සංස්කෘතික සේවා, සංචාරක නියෝජිතායතන, ප්‍රවාහන සේවා, ප්‍රවාහන උපකරණ සැපයීමේ සේවා සහ නේවාසික නවාතැන් පහසුකම් සපයන ඒකක වැනි උප අංශවල සමස්ත රැකියා නියුක්තිය 6% කින් පහත වැටී ඇත . ඒ බව හෙළි කරන දත්ත මගින් සාප්පු සහ වෙළඳසැල්, ස්පා සහ සුවතා මධ්‍යස්ථාන සහ ආපනශාලා උප අංශවල රැකියා අහිමිවීම් ද පෙන්නුම් කරයි .

**වගුව 2.2 අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක වටිනාකම් දාමයේ රැකියා නියුක්තිය - 2021 (සේවක සංඛ්‍යාව)**

| ව්‍යාපාර කාණ්ඩය | පිරිමි | ගැහැණු | මුළු | කාන්තා% |
|---|---|---|---|---|
| හෝටල් | 120 | 45 | 165 | 27.3 |
| ගෙස්ට් හවුස් හෝ නේවාසිකාගාර | 123 | 32 | 155 | 20.6 |
| නිවෙස් ආශ්‍රිත නවාතැන් දීමේ ඒකක | 145 | 46 | 191 | 24.1 |
| ආපනශාලා සහ ඒ හා සමාන | 175 | 32 | 207 | 15.5 |
| ප්‍රවාහන සේවා | 180 | 24 | 204 | 11.8 |
| සංචාරක ආයතන සහ ඒ හා සමාන | 92 | 34 | 126 | 27.0 |
| සංස්කෘතික සේවා/ශිල්ප ක්‍රියාකාරකම් | 135 | 67 | 202 | 33.2 |
| ක්‍රීඩා සහ අනෙකුත් විනෝදාත්මක සේවා | 58 | 14 | 72 | 19.4 |
| ප්‍රවාහන උපකරණ කුලියට දීම | 84 | 26 | 110 | 23.6 |
| සාප්පු සහ වෙළඳසැල් | 102 | 48 | 150 | 32.0 |
| ස්පා සහ සුවතා මධ්‍යස්ථාන, රූපලාවන්‍යාගාර | 25 | 87 | 112 | 77.7 |
| සංචාරක හිතකාමී ආහාර ගන්නා ස්ථාන | 21 | 36 | 57 | 63.2 |
| මුළු | 1260 | 491 | 1751 | 28.0 |


මූලාශ්‍රය: DCS සහ DS

හිමිකාරිත්වය සම්බන්ධයෙන් ගත් කල, ව්‍යාපාර වලින් 92% ක් ක්‍රියාත්මක වන්නේ තනි පුද්ගල ව්‍යාපාර ලෙස වන අතර ඉතිරිය හවුල් ව්‍යාපාර (5%) සහ පුද්ගලික සීමාසහිත සමාගම් (2%) ලෙස ක්‍රියාත්මක වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ වීඑෑ හි කාන්තා හිමිකාරිත්වය යාබද දිස්ත්‍රික්කවලට සාපේක්ෂව (22%) ඉතා අඩුය (8%). ව්‍යාපාර වර්ධනය සහ ව්‍යාප්තිය සඳහා ඩිජිටල්කරණයේ විභව ප්‍රතිලාභ පිළිබඳව අනුරාධපුරයේ සංචාරක අංශයේ වීඑෑ හිමිකරුවන්ගෙන් 90% කට වැඩි ප්‍රමාණයක් දැනුවත්ව සිටිති. ඔවුන්ගෙන් 97% කට පමණ ජංගම රවුටරය/ඩොංගල් මාදිලිය (90%) සහ ස්ථාවර රැහැන්/බ්‍රෝඩ්බෑන්ඩ් පහසුකම් (83%) හරහා අන්තර්ජාල සම්බන්ධතා ඇත. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් අන්තර්ජාල අලෙවිකරණය සහ සන්නිවේදනය, මාර්ගගත සමාලෝචන අධීක්ෂණය, සමාජ මාධ්‍ය භාවිතය සහ ඩිජිටල් උපකරණ හැසිරවීම සඳහා අන්තර්ජාල පහසුකම් ද භාවිතා කරති. එබැවින්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ වීඑෑ හි තාක්ෂණික සූදානම ඉතා ඉහළ මට්ටමක පවතී.

සංචාරක අංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක හිමිකරුවන් ද තම සේවකයන්ගේ නිපුණතා සංවර්ධනය කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන බව පෙනෙන අතර ප්‍රධාන පුහුණු මූලාශ්‍ර වන්නේ රැකියාව අතරතුර පුහුණුව (73%) සහ අභ්‍යන්තර පුහුණුව (50%) ය. නිපුණතා සංවර්ධනය සඳහා 4ෂධ ව්‍යාපෘති මැදිහත්වීම්වලට සහභාගී වීමට වීඑෑ හි ඇති කැමැත්ත පිළිබඳව ඇති දත්ත මඟින් ගමනාන්ත සංවර්ධනය (43%), පදනම් ආගන්තුක සත්කාරය (37%), වෘත්තීය ඉවුම් පිහුම් (37%), ඩිජිටල් අලෙවිකරණය (20%) සහ ව්‍යාපාර වැඩිදියුණු කිරීම සඳහා පුහුණුවක් ලැබී නැත.

පුහුණු කිරීමට (17%) ඉහළ මනාපයන් ඇති බව හෙළි වේ.

**රූපය 2.2: කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපාර හිමිකරුගේ පුහුණුව - %**





මූලාශ්‍රය: S4IG 2022.

COVID වලට පෙර සංචාරක අංශයේ MSME හි වාර්ෂික පිරිවැටුම එක් ව්‍යවසායයකට මිලියන 7.6 ක් පමණ වූ අතර 2021 3 වන කාර්තුවේදී එය රු. මිලියන 2.6 ලෙස ආදායමෙන් 66% ක පහත වැටීමක් පෙන්නුම් කරයි (S4IG). MSME හිමිකරුවන්ගේ පුහුණු පැතිකඩ තක්සේරු කිරීමේදී ප්‍රමාණවත් පුහුණුවක් නොමැතිකම සහ පළාත තුළ ඇති සංචාරක වටිනාකම් දාමයේ ව්‍යවසායක සංස්කෘතියක් නොමැති බව අනාවරණය වේ. උදාහරණයක් වශයෙන්, ව්‍යාපාර හිමියන්ගෙන් 50% ක් පමණ කිසිදු පුහුණුවක් ලබා නොමැති අතර අලෙවිකරණය පිළිබඳ යම් පුහුණුවක් ලබා ඇත්තේ 7%ක් පමණි (රූපය 2.2). ඒ හා සමානව, කළමනාකරණය, රැකියා විශේෂිත කුසලතා, මූල්‍ය සහ ව්‍යවසායකත්වය පිළිබඳ පුහුණුව පිළිවෙලින් 13% සහ 20% කි. MSME හිමිකරුවන්ගෙන් තුනෙන් දෙකකට ආසන්න (64%) ප්‍රමාණයකට ඉදිරි වසර කිහිපය තුළ සිය ව්‍යාපාර ව්‍යාප්ත කිරීම වෙනුවෙන් කිසිදු සැලසුමක් නොමැත. කෙසේ වෙතත්, ධනාත්මක පැත්තෙන්, ඔවුන්ගෙන් 37% ක් පමණ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යෙදුම් පිළිබඳ පුහුණුව ලබා ඇත. S4IG ප්‍රමුඛ උපකාරක වැඩසටහන් වලට සහභාගී වීමට ඇති කැමැත්ත අනුව, ගමනාන්ත අලෙවිකරණයට (52%) ඉහළම මනාපය හිමි වන අතර පසුව පදනම් සත්කාරක කුසලතා (44%) සහ වෘත්තීය ඉවුම් පිහුම් (44%) වලට කැමැත්ත හිමි වේ. සංචාරක අංශයේ ව්‍යාපාර හිමිකරුවන්ගෙන් 93% ක් පමණ ව්‍යාපාර ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය කිරීමේ ඇති විභව ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් ය.


රූප සටහන 2.3 හි අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරයට COVID-19 හි බලපෑම විශ්ලේෂණය කර ඇති අතර එය 2020 දී 73% කින් පහත වැටී ඇත. විදේශීය සහ දේශීය වෙළඳපල කොටස් අනුව, විදේශීය සහ දේශීය අමුත්තන්ගේ ඉල්ලුම පහත වැටීම පිළිවෙලින් 75% සහ 65% විය. කෙසේ වෙතත්, 2022 දී සංචාරක කර්මාන්තය ප්‍රකෘතිමත් වීම 44% ක් වූ අතර එය යාබද දිස්ත්‍රික්ක දෙකක 10% ක් සහ 17% ක් විය (රූපය 2.4).

**රූපය 2.3: 2020 දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයේ කාර්ය සාධනය**





මූලාශ්‍රය: S4IG 2022.

**රූපය 2.4: අනුරාධපුර දිස්ත්‍රික්කයේ විදේශීය අමුත්තන් නැවත ස්ථාපිත වීම - අමුත්තන්ගේ රාත්‍රීන්**




මූලාශ්‍රය: SLTDA

**රූපය 2.5: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවන චක්‍රය**




මූලාශ්‍රය: බට්ලර් (1980)

බට්ලර් (1980) වර්ගයේ, සංචාරක ප්‍රදේශයේ ජීවන චක්‍රය (TALC) ආකෘතියේ විස්තර කර ඇති පරිදි, සංචාරක ගමනාන්ත සංවර්ධනය සඳහා අදියර හයක් ඇතුළත් වේ: (1) ගවේෂණය, (2) මැදිහත්වීම, (3) සංවර්ධනය, (4) ඒකාබද්ධ කිරීම, (5) එකතැන පල්වීම සහ (6) පිරිහීම / පුනර්ජීවනය (රූපය 2.5). ඒ අනුව, අනුරාධපුරයේ සංචාරක කර්මාන්තය පවතින්නේ මැදිහත්වීමේ සිට සංවර්ධනය දක්වා අඛණ්ඩව ය. කඩඑෂෘ අර්බුධකාරී කාලසීමාව තුළ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරයේ සාපේක්ෂ තත්ත්වය තවදුරටත් පහත වැටුණු අතර ආර්ථිකයේ පිරිහෙන මහා පරිමාණ ආර්ථික තත්ත්වයන් නිසා එය යථා තත්ත්වයට පත්වීම ප්‍රමාද විය. මෙය 2022 දී ගෝලීය සහ කලාපීය මට්ටමින් සංචාරක ව්‍යාපාරය වේගවත් ලෙස ප්‍රකෘතිමත් වීම හා සසඳා බැලූ විට වෙනස් තත්වයක් වේ. ගෝලීය සහ දකුණු ආසියානු කලාපයේ අනෙකුත් තරඟකාරී ජාතීන් විසින් ලබා ඇති ජයග්‍රහණවලට සාපේක්ෂව 2022 දී ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රතිසාධනය ඉතා දුර්වල විය . ඇත්ත වශයෙන්ම, ගෝලීය සාමාන්‍යයට (-37%) සාපේක්ෂව දකුණු ආසියාව 2022 දී හොඳම ප්‍රතිසාධන අනුපාතය (-24%) වාර්තා කරන අතර ජූලි, ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී එය පූර්ව කඩඑෂෘ සංචාරක පැමිණීම් ඉක්මවා ඇත.


පශ්චාත්-COVID ප්‍රතිසාධන කාලපරිච්ඡේදය තුළ බට්ලර් වර්ගයේ TALC වල වලංගුභාවය විවිධ ගමනාන්තයන්ගේ සන්දර්භයන් තුළ Butler (2021) ඇතුළු විද්වතුන් කිහිප දෙනෙකු විසින් නැවත පරීක්ෂා කර ඇත. Butler (2021) පශ්චාත්-COVID ව්‍යාපාර ප්‍රතිසාධනයේ ඇති විය හැකි චක්‍ර තුනක් ගැන සාකච්ඡා කරයි: a) COVID මුල් චක්‍රය, b) COVID මැද චක්‍රය සහ c) පසු COVID චක්‍රය. පවතින ආර්ථික අර්බුදයේ බරපතලකම සහ දේශපාලන අස්ථාවරත්වය සැලකිල්ලට ගෙන, සංශෝධිත TALC හි මුල් චක්‍ර අවධියෙහි සිටින රටක් ලෙස ශ්‍රී ලංකාව නම් කිරීමට බොහෝ දුරට ඉඩ තිබේ. මෙයින් අදහස් කරන්නේ 2023 අවසානය දක්වා, ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය 'සාමාන්‍ය' ජීවන චක්‍රයක් හරහා ප්‍රගතිය කරා ගමන් කිරීමක් නැවත ආරම්භ නොවනු ඇති බවයි. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වත්කම් සංරක්ෂණය කිරීම, නව වෙළඳපල සහ නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ වඩා හොඳින් නිර්වචනය කිරීම, සංචාරක ආර්ථිකයේ කොටස්කරුවන් ලෙස ප්‍රධාන පාර්ශවකරුවන් සහ ප්‍රාදේශීය ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම සහ ඇතුළත් කිරීම සිදු කළ හැකි වන ලෙස එහි වටිනාකම් යෝජනාව නැවත සකස් කළ යුතුය. සංචාරක කර්මාන්තය මධ්‍යයේ සහ ඒ වටා සිටින සේවා සපයන්නන් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ව්‍යාපාරික ප්‍රකෘතිමත් වීම වේගවත් කිරීම සඳහා නව්‍ය ප්‍රවේශයක් ගත යුතුය. ව්‍යාපාර ප්‍රකෘතියේ මන්දගාමී ප්‍රගතිය සංචාරක කර්මාන්තයේ ශ්‍රම වෙළඳපල කාර්යක්ෂමතාවයට සෘජු බලපෑමක් ඇති කරනු ඇත.

## 2.5 අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිපුණතා සංවර්ධන තත්ත්වය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ නිපුණතා සංවර්ධනය ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM - 68%) ප්‍රමුඛ රාජ්‍ය අංශයේ පුහුණු සපයන්නන් විසින් ආධිපත්‍යය දරන අතර ඉතිරිය VTA (19%), NAITA (6%), විශ්වවිද්‍යාල/විද්‍යාල (4%) සහ ශ්‍රී ලංකා තරුණ සන්විධානය (2%) අතර බෙදී යයි. මෙම පුහුණු සපයන්නන් විසින් ශිල්ප සහ සහතික මට්ටමේ වැඩසටහන් දෙකම ආවරණය වන පරිදි සංචාරක අංශයේ නිපුණතා සංවර්ධනය සඳහා සෘජුවම අදාළ වැඩසටහන් 20ක් ඉදිරිපත් කරයි. දොන් බොස්කෝ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය (නොච්චියාගම) යනු NVQ 3 මට්ටමේ ඉවුම් පිහුම් පිළිබඳ වැඩසටහනක් ඉදිරිපත් කරන එකම පුද්ගලික පුහුණු සපයන්නා වේ (රූපය 2.6). අනුරාධපුරයේ සංචාරක අංශයේ නිපුණතා සංවර්ධනය සඳහා මෑතකාලීනව පුද්ගලික අංශයේ සහභාගීත්වය වන්නේ සූපශාස්ත්‍ර, ආහාර පාන සහ හෝටල් මෙහෙයුම් පිළිබඳ පුහුණුව ලබා දෙන ස්විට්සර්ලන්තය පදනම් කරගත් RISCO වැඩසටහනයි. ඉවුම් පිහුම් යනු වඩාත් ජනප්‍රිය වැඩසටහන වන අතර නව සිසුන් බඳවා ගැනීම් වලින් 31% ක් ඒ සඳහා වේ. මීට අමතරව, ආපනශාලා සහ බාර් සේවාව, පේස්ට්‍රි සහ බේකරි, ආහාර සහ පාන වර්ග සහ ගෘහ පාලනය ද සංචාරක ව්‍යාපාරයේ ඉහළ ඉල්ලුමක් ඇති වැඩසටහන් වේ.

COVID-19 ට පෙර සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත වැඩසටහන් සඳහා බඳවා ගැනීම් සහ උපාධි ප්‍රදානය පිළිවෙලින් සිසුන් 559 ක් සහ 415 ක් පමණ විය. අතර මැද අතහැර දැමීමේ අනුපාතය 26% ක් පමණ විය. COVID අර්බුදය TVT අංශයේ ක්‍රියාකාරීත්වයට බරපතල ලෙස බලපෑ අතර 2019 ට සාපේක්ෂව 2021 වසරේ සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත වැඩසටහන් සඳහා බඳවා ගැනීමේ සහ උපාධි ප්‍රදානයේ පහත වැටීම පිළිවෙලින් 41% සහ 34% විය. සංචාරක අංශයේ නිපුණතා සංවර්ධනය සඳහා කාන්තා සහභාගිත්වය 2019 දී 12% ක් වූ අතර එය 2021 දී 23% දක්වා ඉහළ ගොස් ඇත. මෙය ජාතික මට්ටමින් නිරීක්ෂණය කරන ලද පොදු රටාවක් වන අතර මෙමගින් දිස්ත්‍රික් මට්ටමින් පවා සේවක සන්ඛ්‍යාවට අමතර බලපෑමක් ඇති කරන බව හඳුනාගත් අවස්තාවකි.

**රූපය 2.6: අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ නිපුණතා සංවර්ධනයේ හවුල්කරුවන්%**





මූලාශ්‍රය: S4IG Field Survey (2022)

## 2.6 ශ්‍රම වෙළඳපොලේ අඩු කුසලතා සමතුලිතතාවය පිළිබඳ සාක්ෂි

ශ්‍රී ලංකාවේ, වසංගතයට පෙර සිටම සංචාරක වටිනාකම් දාමයට අදාළ නිපුණතා වලින් හෙබි අයගේ හිඟය තීරණාත්මක සාධකයක් විය. සංචාරක ව්‍යාපාරය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමත්, නිපුණ, අර්ධ පුහුණු සහ පුහුණු ශ්‍රමිකයින් විශාල වශයෙන් සංක්‍රමණය වීමත් සමඟ පශ්චාත් වසංගත කාලපරිච්ඡේදය තුළ, නිපුණතා හිඟය පිළිබඳ ගැටලුව උග්‍ර වී ඇති අතර, සංචාරක ක්ෂේත්‍රය 2021 දී එහි අගය දාමයේ විධිමත් (9%) සහ අවිධිමත් (91%) අංශ වල (TVEC 2022) පුරප්පාඩු ඉහළම මට්ටමින් (23981) වාර්තා කළේය. රැකියා කාණ්ඩය අනුව, 2021 දී කුක්, වේටර්, මුළුතැන්ගෙයි සහායක, කොත්තු සාදන්නා, මුදල් අයකැමි, රූම් බෝයි, ස්ටුවර්ඩ්, සහායක සහ බේකර් කාණ්ඩවල පිරවීමට නොහැකි වූ පුරප්පාඩු වැඩිම සංඛ්‍යාවක් වාර්තා විය. පිරවිය නොහැකි වූ පුරප්පාඩු වල තත්වය දිස්ත්‍රික් මට්ටමින් ඇති අඩු වැටුප්, ප්‍රමාණවත් පුහුණු පහසුකම් නොමැති කම, සීමිත වැඩසටහන් මිශ්‍රණය, ප්‍රමාණවත් කර්මාන්ත සහ ආයතනික සහයෝගය නොමැතිකම සහ සම්පත් හිඟකම හේතුවෙන් තවත් වැඩි අගයක් ගන්නා ලදි.


අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළු සංචාරක අංශයේ MSMEs පිළිබඳ මෑත සමීක්ෂණයකින් හෙළි වූයේ ඉහළ නිපුණතා සහිත වෘත්තීන්හි ඔවුන්ගේ සගයන් හා සසඳන විට මධ්‍යම හා අඩු කුසලතා ඇති සේවකයින් අතර බරපතල කුසලතා හිඟයක් පවතින බවයි (S4IG, 2022). කර්මාන්ත උප අංශ වලට අනුව, නවාතැන් අංශයට සාපේක්ෂව ආහාර සේවා උප අංශයේ නිපුණතා පරතරය වැඩි වන අතර පරිමාණය පිළිබඳව සළකා බලන විට නිපුණතා හිඟය ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ සමාගම්වලට සාපේක්ෂව මධ්‍යම පරිමාණ සමාගම්වල වැඩි බව හඳුනා ගන්නා ලදි. නිපුණතා වර්ගය අනුව, ඩිජිටල්, තාක්ෂණික, ව්‍යාපාර සහ මෘදු නිපුණතා වල ඉහළම කුසලතා හිඟයන් වාර්තා වී ඇති අතර එසේ වාර්තා වී ඇත්තේ විශේෂයෙන්ම අඩු කුසලතා සහිත සේවකයින් අතර (රූපය 2.7, 2.8, සහ 2.9) වේ.

**රූප සටහන 2.7: ඉහළ නිපුණතා සහිත සේවකයින් අතර නිපුණතා හිඩැස්**





මූලාශ්‍රය: S4IG (2022).

**රූප සටහන 2.8: මධ්‍යම නිපුණතා මට්ටමේ සේවකයින් අතර නිපුණතා හිඩැස්**




මූලාශ්‍රය: S4IG (2022).

**රූපය 2.9: අඩු නිපුණතා මට්ටමේ සේවකයින් අතර නිපුණතා හිඩැස්**




මූලාශ්‍රය: S4IG (2022).

නිපුණතා හිඟය පිළිබඳ ගැටළු පුරවා නොමැති පුරප්පාඩු අනුව ද විශ්ලේෂණය කරන ලද අතර, එය ආපනශාලා (20%), හෝටල් (12%) සහ බංගලා / නිවාඩු නිකේතන (10%) යන උප අංශවල වැඩි අගයක් ගත් අතර රැකියා කාණ්ඩය අනුව, පුරවා නොමැති පුරප්පාඩුවල ඉහළම අනුපාතය ප්‍රධාන රැකියා කණ්ඩායම් දෙකක් වන කුක් (23%) සහ වේටර් (16%) ලෙස වාර්තා විය. දිස්ත්‍රික් මට්ටමින් පාර්ශ්වකරුවන්ගෙන් විමසූ විට බහු කාර්ය කටයුතු කළ යුතු තනතුරු, ඩිජිටල් කුසලතා, විද්‍යුත් සංචාරක ව්‍යාපාරය, ව්‍යාපාර කළමනාකරණය, ඉවුම් පිහුම්, නව තාක්ෂණය භාවිතය (ICT) සහ සංචාරක මඟපෙන්වීම වැනි අන්ශ වල ඇති කුසලතා හිඩැස් ද අනාවරණය විය. මේවා අඩු නිපුණතා සමතුලිතතාවය පිළිබඳ පැහැදිලි සලකුණු වන අතර ඒ සඳහා හේතු කිහිපයක් අනුමාන කළ හැකිය: අ) ප්‍රමාණවත් පුහුණුවක් නොලැබීම, ආ) සීමිත වැඩසටහන් මිශ්‍රණය, ඇ) අඩු ගුණාත්මක පුහුණුව, ඈ) සේවකයින් පිටතට ගලා යාම, ඉ) අඩු වැටුප්, සහ ඊ) COVID කාල සීමාව තුළ කම්කරුවන් වෙනත් කර්මාන්ත අංශ වෙත විස්ථාපනය කිරීම එම හේතූන් වේ.

වෘත්තීය ඉවුම් පිහුම්, පදනම් ආගන්තුක සත්කාර, ඩිජිටල් අලෙවිකරණය සහ ගමනාන්ත සංවර්ධනය යන ක්ෂේත්‍රවල නිපුණතා සංවර්ධන කටයුතු සඳහා සහභාගී වීමට MSME හිමිකරුවන්ගේ ඇති ඉහළ කැමැත්ත සුභවාදී කරුණක් ලෙස පෙන්නුම් කරයි. මීට අමතරව, MSME හිමිකරුවන්ගෙන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් ව්‍යාපාර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට ඔවුන්ගේ ඇති කැමැත්ත දක්වා ඇත . සාමාන්‍ය පෙළ සහ උ/පෙළ අධ්‍යාපනය සමග අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුහුණු වෙළඳපොළට අලුතින් එක්වන්නන් වසරකට 7500ක් පමණ වේ.

## 2.7 ජාතික සහ දිස්ත්‍රික් මට්ටමින් සංචාරක අංශය සඳහා ප්‍රතිපත්ති උපදෙස්

පළමු පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි, අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා වන SSAP, නිපුණතා සංවර්ධනය පිළිබඳ ජාතික සහ උප-ජාතික මට්ටමේ ප්‍රතිපත්ති උපදෙස් ආවරණය වන ප්‍රධාන ප්‍රතිපත්ති ලේඛන අටක් මගින් මෙහෙයවනු ලැබේ. පළමු, ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ලේඛන මගින් වැඩි සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට සහ MSME සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවරයන් දක්වා ඇත. සංචාරක උපායමාර්ගික සැලැස්ම (2022-2025) ප්‍රධාන සංචාරක නගරවල සංචාරක පුහුණු පාසල් පිහිටුවීම සහ ආකර්ශනීය පාඨමාලා වැඩසටහන් හඳුන්වාදීම හරහා කුසලතා සංවර්ධනය ඇතුළුව අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර 17ක් සමඟ කටයුතු කරයි. රාජ්‍ය ආයෝජන වැඩසටහන (2021-2024) මගින් මානව සම්පත් සංවර්ධනය, කෘෂි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සහ නිෂ්පාදන විවිධාංගීකරණය යන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක සංචාරක කර්මාන්තයේ දියුණුව සඳහා රු මිලියන 85,381 වෙන් කර ඇත, ටීවීඊටී අංශය සඳහා ජාතික සංවර්ධන සැලැස්මට (2023-2027), නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණුවේ සියලුම අංග ආවරණය වන අතර එය තේමා 06ක් යටතේ එකලස් කර ඇති ප්‍රතිපත්ති 73 කින් සමන්විත වේ. අ) තාක්ෂණික, වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ප්‍රවේශය, ආ) පුහුණු වර්ධනයන් සහ පුහුණුව තාර්කික කිරීම, ඇ) ශ්‍රම වෙළඳපල තොරතුරු සහ ඩිජිටල්කරණය, ඈ) කර්මාන්ත සම්බන්ධතා සහ ශ්‍රම බලකාය සංවර්ධනය, ඉ) TVE හි තත්ත්ව සහතිකය සහ පිළිගැනීම, සහ ඊ) TVET හි භෞතික හා මූල්‍ය සම්පත් සහ මානව සම්පත් පිළිබඳ අදහස් කළමනාකරණය කිරීම, උප-ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ලේඛන තුනෙන්, අනුරාධපුර දිස්ත්‍රික් පස් අවුරුදු සංවර්ධන සැලැස්ම (2018-2022)

දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට අදාළ ගැටලු, ගැටලු සහ අභියෝග පිළිබඳ ප්‍රයෝජනවත් තොරතුරු සපයයි (DS-2018, ව.87 ) එය ප්‍රධාන ගැටළු සහිත ක්ෂේත්‍ර හතරක් ආවරණය කරන අතර ඒවා නම් : a) සංචාරක කරඬමාන්ත සංවර්ධනය සඳහා යෙදවුම්, b) පරිසරය සක්‍රීය කිරීම, c) තාක්ෂණය සහ දැනුම, සහ d) සංචාරක නිෂ්පාදන අලෙවිකරණය වේ. එය දිශා හතරක පරිසරයක් භාවිතා කරමින් දිස්ත්‍රික්කයේ සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ තත්ත්ව විශ්ලේෂණ ඉදිරිපත් කරන අතර ප්‍රධාන කරුණු විස්සක් ඉස්මතු කරයි. ඉන් පහක් වන අ) පුහුණු ශ්‍රමය නොමැතිකම, ආ) සංචාරක නිෂ්පාදන නිසි ලෙස අලෙවි කිරීම පිළිබඳ අවබෝධය නොමැතිකම, ඇ) අලෙවිකරණය සඳහා තාක්ෂණය භාවිතා නොකිරීම, ඈ) සංචාරක ව්‍යාපාරය පිළිබදව ඇති දුර්වල ව්‍යවසායක සංස්කෘතිය, සහ ඉ) සංචාරක ව්‍යාපාරය සඳහා ඇති දුර්වල රාජ්‍ය ප්‍රතිපත්ති මීන් ප්‍රධාන තැන ගනී. දිස්ත්‍රික් මට්ටමේ අනෙකුත් ලේඛන දෙක අතුරින් අනුරාධපුරය සඳහා වන නාගරික සංවර්ධන සැලැස්ම (2019-2030) ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික්කයේ සංචාරක සංවර්ධනයක් යෝජනා කරන අතර එමගින් පශ්චාත්-අර්බුද සමයක සංචාරක අංශය සංවර්ධනය කිරීමේ දී වඩාත් වලංගු වන බව පෙනෙන ඉඩම් පරිහරණය සහ භෞතික සැලසුම්, දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු පිළිබදව තොරතුරු ලබාදෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ආදී දෑ පිළිබඳව සලකා බලනු ලැබේ. ඉහත ප්‍රතිපත්ති ලේඛන මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය සඳහා නිපුණතා සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රමාණවත් උපදෙස් සහ මාර්ගෝපදේශ සපයයි. නිපුණතා සංවර්ධනය, සේවා අලෙවිකරණය සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම සහ සංචාරක ව්‍යාපාරයෙහි දුර්වල ව්‍යවසායකත්ව සංස්කෘතිය සඳහා මැදිහත් වීමේ හදිසි අවශ්‍යතාව ද ඉන් අවධාරණය කරයි. නිපුණතා සංවර්ධනය තුළින් අර්බුධයකින් පසු සංචාරක ව්‍යාපාරය ව්‍යාපාර ප්‍රකෘතිමත් කිරීම සඳහා උපාය මාර්ගික මැදිහත්වීම් සිදු කිරීමේ අරමුණින් මෙම අංශ 3 වන පරිච්ඡේදයෙන් තවදුරටත් විමර්ශනය කරනු ලැබේ.

## 2.8 ආයතනික ආධාරක පද්ධතිය

කාර්යක්ෂම ආයතනික ආධාරක පද්ධතියක් කුසලතා සංවර්ධනය සඳහා පූර්ව අවශ්‍යතාවයකි. ජාතික මට්ටමින්, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය (MTL) අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ රට තුළ සංචාරක හා නිපුණතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කරුවන් සම්බන්ධීකරණය කිරීම සිදු කරයි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) එඔබ යටතේ ක්‍රියාත්මක වන අතර දිවයින පුරා පිහිටි පළාත් පාසල් හරහා සංචාරක ක්ෂේත්‍රයේ නිපුණතා සංවර්ධන වැඩසටහන් ඉදිරිපත් කරන අතර ශිෂ්‍ය බඳවා ගැනීම් සහ පුහුණුවීම් අවස්තා ප්‍රදානයන් 31ක් පමණ සපයයි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) ද MTL හි අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර එය ප්‍රධාන වශයෙන් සංචාරක කර්මාන්තය සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. නිපුණතා සංවර්ධන ක්ෂේත්‍රය තුළ, අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC), රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන වල පුහුණු සපයන්නන් නියෝජනය කරන, දිවයින පුරා පිහිටි ආයතන 560 ක ජාලය හරහා සංචාරක ඇතුළු පුළුල් ක්ෂේත්‍ර 19 ක නිපුණතා සංවර්ධන වැඩසටහන් පවත්වයි. වාර්ෂිකව TVEC වෙත බඳවා ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව නියෝජනය කරන කොටස සහ උපාධි ප්‍රදානයට සුදුසුකම් ලබන කොටස 69% ක් පමණ වේ. එහි වැඩසටහන් මිශ්‍රණය SLITHM හි වැඩසටහන් මිශ්‍රණයට වඩා බෙහෙවින් පුළුල් ය. මීට අමතරව, වනජීවී සහ වන සංරක්ෂණ, සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ඇතුළුව සංචාරක ව්‍යාපාර සංවර්ධනය සඳහා ආයතනික සහයෝගය ලබා දෙන තවත් වැදගත් අමාත්‍යාංශ කිහිපයක් තිබේ. සංචාරක අංශය ඇතුළු දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (DS) අන්තර් හා අන්තර් ආයතන සම්බන්ධීකරණය සපයයි. ප්‍රධාන තීරණ ගැනීමේ ආයතනය වන්නේ දිසාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් දිස්ත්‍රික් සංවර්ධන කමිටුව (DDC) ය.

සංචාරක ව්‍යාපාරය බලයක් ඇති විෂයක් බැවින්, දිස්ත්‍රික් මට්ටමින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේදී පළාත් සභා (PCS) ද ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. උතුරු මැද පළාතේ (NCP), සංචාරක කර්මාන්ත සංවර්ධන කටයුතු උතුරු මැද පළාතේ ප්‍රධාන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංචාරක අමාත්‍යාංශය යටතට පැමිණේ. එහි ප්‍රධාන කාර්යය වන්නේ ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව සංචාරක අංශයේ සංවර්ධනය සඳහා අවශ්‍ය උපාය මාර්ග සහ ක්‍රියාකාරී වැඩසටහන් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම ය. උතුරු මැද පළාතෙහි සංචාරක අංශයේ සංවර්ධන කටයුතු වෙනම අංශයක් මගින් සිදු කරනු ලබන නමුත් එහි සංවර්ධන කටයුතු වලට අදාල

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර ඇති අරමුදල් ඉතා සීමිත වේ.
ශ්‍රී ලංකාවේ, භෞමික ධුරාවලිය මධ්‍යම, පළාත් සහ ප්‍රාදේශීය යන මට්ටම් තුනකට බෙදී ඇත. සංචාරක ක්ෂේත්‍රය සමගාමී විෂයයක් වන බැවින්, එම මට්ටම් තුනටම විෂය හැසිරවීමේ වගකීමක් ඇති අතර, එසේ කටයුතු කිරීම සඳහා ඉහළ මට්ටමේ සහයෝගීතාවයක් අවශ්‍ය වේ. අනුරාධපුරය පළාතෙහි අගනුවර වන බැවින් ජනතාවට විවිධ සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය ආයතනික සැකැස්ම එහි ඉතා හොඳින් වර්ධනය වී ඇත. එය ප්‍රධාන වශයෙන් නියෝජනය වන්නේ මධ්‍යම, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ පරිපාලනය, බැංකු ඇතුළු මූල්‍ය ආයතන, කෘෂිකාර්මික සේවා සපයන්නන් සහ අනුරාධපුර ප්‍රාදේශීය ආර්ථිකයේ කොටස්කරුවන් වන අනෙකුත් සංවර්ධන සංවිධාන විසිනි. මෙහෙයුම් කොන්දේසි වලට අනුව, දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන කටයුතු රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන ජාලයක් මගින් සිදු කරනු ලබන අතර ඒ සියල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමඟ අන්තර් සම්බන්ධිත වේ. දිසාපති/දිස්ත්‍රික් ලේකම් දිස්ත්‍රික් පරිපාලනයේ ප්‍රධානියා වන අතර ඔහු/ඇය විසින් විවිධ කමිටු හරහා දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සිදු කරයි. පුහුණුව සැපයීම, සේවා අලෙවිකරණය, යටිතල පහසුකම් සංවර්ධන සහය, ව්‍යාපාර සංවර්ධනය යනාදිය ලබා දෙමින් සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනයට සහාය වීමට දිස්ත්‍රික් මට්ටමේ ආයතන කිහිපයක් ඇත. කෙසේ වෙතත්, දිස්ත්‍රික් මට්ටමින් නිසි සම්බන්ධීකරණ ව්‍යුහයක් නොමැතිකම නිසා පාර්ශවකරුවන් ඵලදායී ලෙස සම්බන්ධීකරණය කළ නොහැකි වීම සහ දිස්ත්‍රික්ක සහ ජාතික මට්ටමේ සංචාරක බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට නොහැකි වීම පාර්ශවකරුවන් විසින් ප්‍රධාන අඩුපාඩුවක් ලෙස හඳුනාගෙන ඇත.

## 2.9 සාරාංශය

මෙම පරිච්ඡේදය මගින් දිස්ත්‍රික් මට්ටමින් සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට ඇති අවස්ථා සහ ඉඩකඩ, උපාය මාර්ගික දිශානතිය සහ ඉල්ලුමේ සහ සැපයුමේ බාධාවන්ගේ බලපෑම හේතුවෙන් ශ්‍රම වෙළඳපොළේ අකාර්යක්ෂම ක්‍රියාකාරිත්වය පිළිබඳව අවධානය යොමු කරන ලදි. මීට අමතරව, දැනට පවතින ආයතනික ආධාරක පද්ධතිය ද සංචාරක කර්මාන්තයේ සංවර්ධන අපේක්ෂාවන්ට දැඩි ලෙස බලපාන ප්‍රධාන සාධකයක් බව පෙනේ. මේ අනුව, අනුරාධපුරයේ සංචාරක කර්මාන්තයේ නිපුණතා සංවර්ධනය සඳහා හොඳම විකල්පය ලෙස සියලු පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම්වල සහයෝගයෙන් සිදු කරන සහ අන්තර් ප්‍රවේශයක් සුදුසු බැව් දක්නට ලැබේ.

# 3 වන පරිච්ඡේදය

# සංචාරක වටිනාකම් දාමයේ කුසලතා සංවර්ධනය සඳහා වන අභියෝග සහ උපාය මාර්ග



## 3.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදය මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරයේ සහ ඒ ආශ්‍රිත උප අංශවල නිපුණතා සංවර්ධනය සඳහා වන අභියෝග, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කරයි. එය ආරම්භ වන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරයේ නිපුණතා සංවර්ධන අදියර, අභියෝග, අවස්ථා සහ නිපුණතා සංවර්ධන උපාය මාර්ග පිළිබඳව පැහැදිලි කිරීමෙනි.

## 3.2 ඉල්ලුම් සහ සැපයුම් අංශ වල සීමාවන්

කොවිඩ් අර්බුධයට පසු කාල සීමාව තුළ සංචාරක ව්‍යාපාරයේ ව්‍යාපාර ප්‍රතිසාධනය පිළිබඳ ජාත්‍යන්තර අත්දැකීම් ශ්‍රී ලංකාවට වඩාත් අදාළ සහ බෙහෙවින් දිරිගන්වන සුළු බව පෙනේ. UNWTO (2023) විසින් ප්‍රකාශ කරන ලද පරිදි, සංචාරක කර්මාන්තය මේ වසරේ පූර්ණ ප්‍රකෘතිමත් වීම කරා ගමන් කරමින් සිටින අතර සාමයේ සහ තිරසාරභාවයේ කුළුණක් ලෙස එහි උපරිමය ලබා දීමට සූදානම් වේ. වසංගතය මගින් වඩාත් තිරසාර සංචාරක ආකෘතීන් වෙත සංක්‍රමණය වීම වේගවත් කර ඇති අතර බොහෝ රටවල් ආපදා සහ ව්‍යසනවල බලපෑම් ජය ගැනීම සඳහා ඔරොත්තු දීමේ නියෝජිතයෙකු ලෙස සංචාරක ව්‍යාපාරය භාවිතා කර ඇති බව ද ඔවුන් ප්‍රකාශ කරයි. ඔවුන්ගේ නිෂ්පාදන වෙළඳපොළ නැවත නිර්වචනය කිරීමට, විවිධ වෙළඳපල කොටස් සංවර්ධනය කිරීමට සහ නිෂ්පාදන සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීමට ද එය අවස්ථාවක් විය. මෙම නව්‍ය ප්‍රවේශය ග්‍රාමීය සංචාරක, කෘෂිකාර්මික, ප්‍රජා සංචාරක සහ උරුම සංචාරක ව්‍යාපාරයේ වටිනාකම හඳුනා ගෙන ඇති අතර පශ්චාත් වසංගත සංවර්ධන න්‍යාය පත්‍රය තුළ, කාන්තාවන් සංචාරක සංවර්ධනයේ " මධ්‍ය අවදියක්" ගන්නා බව ද හඳුනාගෙන ඇත (UNWTO 2023). එමෙන්ම එය ග්‍රාමීය සංවර්ධනය සඳහා සංචාරක ව්‍යාපාරයේ වැදගත්කම ද හඳුනා ගනී.

සංචාරක ව්‍යාපාරය ශ්‍රමය-අවශ්‍ය කර්මාන්තයක් වන අතර පශ්චාත් අර්බුද කාලපරිච්ඡේදය තුළ ව්‍යාපාර ප්‍රකෘති භාවයට පත්වීම සෘජුවම නිපුණතා සංවර්ධනය සමඟ සම්බන්ධ වේ. 2 වන පරිච්ඡේදයේ සඳහන් කර ඇති පරිදි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය ක්‍රියාත්මක වන්නේ අඩු ඉල්ලුමක් සහ අඩු පුහුණු ශ්‍රම සැපයුමක් සහිත "අඩු නිපුණතා සමතුලිතතා" අවධියක ය. එවැනි තත්වයක් තුළ, ශ්‍රම වෙළඳපොළ කාර්යක්ෂමව ක්‍රියා නොකරන අතර ඉහළ නිපුණතා සමතුලිතතා අවධියකට සංක්‍රමණය කිරීම සඳහා ඉල්ලුම් සහ සැපයුම් අංශ වල මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ.

කලින් සඳහන් කළ පරිදි, අනුරාධපුරය ශ්‍රී ලංකාවේ හොඳින් ස්ථාපිත සංචාරක ගමනාන්තයක් වන අතර එහි විදේශීය සහ දේශීය අමුත්තන් සඳහා සුවිශේෂී සංචාරක වත්කම් සමූහයක් ඇත. පශ්චාත් කොවිඩ් කාලපරිච්ඡේදය තුළ දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය සඳහා වැඩිවන ඉල්ලුම පැහැදිලි වන අතර එහි පූර්ණ සංවර්ධනය කිරීමට හැකි බව නිපුණතා හිඩැස් සහ හිඟයන් ඇතුළු සාධක කිහිපයක් නිසා සීමා වී ඇත. නිපුණතා හිඩැස් සහ හිඟතා පිළිබඳ ගැටලුවට විසඳුම් ශ්‍රම වෙළඳපොලේ ඉල්ලුම සහ සැපයුම යන දෙඅංශයෙන්ම සකස් කළ යුතුය. ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත්වන විට, ශ්‍රම වෙළඳපොළේ නැගී එන අභියෝගවලට මුහුණ දීම සඳහා දැනට සිටින ශ්‍රම බලකාය ඉහළ නැංවීමට අමතරව නව නිපුණතා සහිත නව ශ්‍රමිකයන් ආකර්ශණය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. ඉල්ලුම පැත්තෙන්, සංචාරක වටිනාකම් දාමයේ ප්‍රධාන ධාවකයන් වන්නේ වැටුප්, ආයතනයේ ප්‍රමාණය, කර්මාන්ත ව්‍යුහය, සේවා මිශ්‍රණය/නිෂ්පාදන මිශ්‍රණය, සැපයුම් දාම සමඟ පවත්වන සම්බන්ධතා, ව්‍යාපාර හිමියන්ගේ අධ්‍යාපනික සහ පුහුණු පසුබිම, මහා පරිමාණ ආර්ථික සමස්ථවල ක්‍රියාකාරිත්වය, නවීන තාක්ෂණය යෙදීම සහ වෙළඳපල ඉල්ලුමේ කාලීන බව වැනි සාධක කිහිපයක් වේ. සංචාරක ක්ෂේත්‍රයේ නිපුණතා පුළුල් ලෙස සංවර්ධනය කිරීමේ රාමුවක් තුළ මෙම බාධක විසඳාගත යුතුය.

ඒ හා සමානව, සංචාරක වටිනාකම් දාමයේ පුහුණු ශ්‍රමිකයින් සඳහා වෙළඳපල ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීමේදී සැපයුම් අංශය ද බාධක කිහිපයකට මුහුණ දී සිටී. සැපයුම් පාර්ශ්වයේ සමහර සීමාවන් අතරට පුහුණුව සඳහා ඇති සීමිත ප්‍රවේශය, සීමිත වැඩසටහන් මිශ්‍රණයන්, රාජ්‍ය නොවන අංශයේ පුහුණු සපයන්නන් ප්‍රමාණවත් නොවීම, කාර්ය මණ්ඩල සංවර්ධනය නොමැතිකම (උදා: පුහුණුකරුවන්ගේ පුහුණුව), මූල්‍ය, මානව සම්පත් සහ යටිතල පහසුකම් පහසුකම් ඇතුළත් ව අනෙකුත් සම්පත් සඳහා ඇති බාධාවන් සහ සංචාරක අංශයේ වෘත්තීන් කෙරෙහි බහුතරයකගේ ඇති සෘණාත්මක ආකල්ප ඇතුළත් වේ.

ගෝලීය මට්ටමින්, සංචාරක ක්ෂේත්‍රය වසංගතයෙන් පසු නැවත යතා තත්වයට පත් වී ඉදිරියට යමින් පවතින අතර සංචාරක ව්‍යාපාරය වඩාත් තිරසාර මාදිලියන් වෙත මාරුවීම ද වේගවත් වී ඇත . කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් මට්ටමින් සැබෑ ප්‍රකෘතිමත් වීමක් ඇති කළ හැක්කේ මහා පරිමාණ ලෙස ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු වී ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරය නැවත ස්තාපිත වූ විට පමණි. මේ සඳහා ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා මහා පරිමාණ ආර්ථික ස්ථාවරත්වය සහ ගෝලීය සහයෝගය අවශ්‍ය වේ.

## 3.3 කුසලතා සංවර්ධනය සඳහා ඇති අභියෝග සහ අවස්ථා

අප මේ වන විට නිපුණතා සංවර්ධනයට බලපාන බාධාවන් හඳුනාගෙන ඇති නිසා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක වටිනාකම් දාමයේ ඇති අභියෝග සහ කුසලතා සංවර්ධන අවස්ථා පිළිබඳ විශ්ලේෂණවල මීළඟ අදියර වෙත යාමට අපට හැකිය. එය අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ ව්‍යාපාරික ප්‍රවර්ධන සහ කුසලතා සංවර්ධනයේ නියැලී සිටින පාර්ශවකරුවන් කොටසකගේ අදහස් හා උපදේශන මත පදනම් වේ. මෙම පදනම මත හඳුනාගත් ප්‍රධාන ඉල්ලුම් සහ සැපයුම් අංශයේ අභියෝග, විශේෂයෙන්ම පශ්චාත් අර්බුද ප්‍රතිසාධන කාලය තුළ සංචාරක කර්මාන්තයට එහි පූර්ණ වර්ධන හැකියාව සාක්ෂාත් කර ගැනීම වලක්වයි. ( වගුව 3.1)

| ඉල්ලුම් අංශය | සැපයුම් අංශය |
|---|---|
| සංචාරක අංශයේ රැකියා සඳහා ඇති ඉල්ලුම අඩු වීම | සුදුසුකම් ලත් පුහුණුකරුවන් නොමැති වීම |
| TVET පාඨමාලා සඳහා ලියාපදිංචි වීම් සහ පුහුණු පාඨමාලා සාර්ථකව අවසන් කිරීම් අඩු වීම | කාන්තාවන් සහ ආබාධිත පුද්ගලයින් වෙත අවධානය යොමු කරන නම්‍යශීලී පුහුණු වැඩසටහන් නොමැතිකම |
| කර්මාන්තය විසින් පිරිනමනු ලබන අඩු වැටුප් | නිපුණතා සංවර්ධනය සඳහා රාජ්‍ය අංශයේ ආයෝජන ප්‍රමාණවත් නොවීම |
| පුහුණුව සහ සංවර්ධනය සඳහා ඇති ප්‍රවේශය සීමිත වීම (ඉහළ කුසලතා) | නිපුණතා සංවර්ධනයේ දී රාජ්‍ය අංශයේ ආධිපත්‍යය |
| සංචාරක අංශයේ වෘත්තීය අපේක්ෂාවන් සහ වෘත්තීය සංවර්ධනය පිළිබඳ දැනුවත්භාවය අඩු වීම | සංචාරක ක්‍රියාකරුවන්ගේ සහ මාර්ගෝපදේශකයන්ගේ කුසලතා සංවර්ධනය සඳහා ආයතනික සහයෝගය නොමැතිකම |
| සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රවර්ධනයක් නොමැතිවීම | පටු වැඩසටහන් මිශ්‍රණය |


මෙම අභියෝග මධ්‍යයේ වුවද, නිපුණතා සංවර්ධනය තුළින් සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීමට සහ ව්‍යාප්ත කිරීමට අනුරාධපුර දිස්ත්‍රික්කයට අවස්ථා කිහිපයක් තිබේ. ඉන් ප්‍රධාන අවස්ථා පහත දැක්වේ.

- දිස්ත්‍රික්කයේ ඇති සංචාරක ව්‍යාපාරවල තිබෙන ඉහළ වර්ධන හැකියාව
- අවභාවිතයට ලක් නොවූ සංචාරක කර්මාන්තය ආශ්‍රිත වත්කම් උදා, උරුමය, ස්වභාවික සුන්දරත්වය, කෘෂි සංචාරක කර්මාන්තය, ආහාර සහ ඉවුම් පිහුම් ක්‍රම සහ සංස්කෘතිය
- දිස්ත්‍රික් නායකත්වය සහ පරිපාලන සහාය
- රජය විසින් ආරම්භ කරන ලද මානව ප්‍රාග්ධන සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට සංවර්ධන හවුල්කරුවන්ගේ ඇති කැමැත්ත .
- දේශීය හා විදේශීය අමුත්තන් ආකර්ෂණය කරගන්නා ආකාරයට සිදුවන ජනප්‍රිය වාර්ෂික ආගමික සිදුවීම් සහ උත්සව
- සාමාන්‍ය පෙළ (4000) සහ උසස් පෙළ (3500) විභාගවලින් පසු වාර්ෂික පදනමින් පාසල් හැරයන 7500 ක් පමණ ශ්‍රම වෙළඳපොළට එක්වීම. සාමාන්‍ය පෙළ විභාගයට පෙර තවත් 2700ක් ශ්‍රම වෙළඳපොළට එක් වෙති.

## 3.4 SWOT විශ්ලේෂණය

තක්සේරුවේ මෙම කොටසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයේ SWOT විශ්ලේෂණය වෙත අවධානය යොමු කරයි. SWOT යනු උපාය මාර්ගික සැලසුම්/විශ්ලේෂණ වලදී බහුලව භාවිතා වන ක්‍රමයකි. එය පදනම් වන්නේ ඉහත 2 වන පරිච්ඡේදයේ සහ 3 වන පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති ප්‍රධාන සොයාගැනීම්, පාර්ශවකරුවන්ගේ උපදේශන සහ දිස්ත්‍රික්කයේ සිටින විවිධ පාර්ශවකරුවන් විසින් ආරම්භ කරන ලද සංචාරක අංශයේ අඛණ්ඩ සංවර්ධන කටයුතු මත ය. එම සොයාගැනීම් පහත 3.1 රූපයේ සාරාංශ කර ඇත.

**රූපය 3. 1: අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයේ නිපුණතා සංවර්ධනය පිළිබඳව සිදු කරන ලද SWOT විශ්ලේෂණය**




**ශක්තීන්**

- අවභාවිතා නොවූ සන්චාරක වත්කම්
- ලෝක උරුමයක් ලෙස හොඳින් ස්තාපිත වූ සන්නාමය
- උපාය මාර්ගික ගුණයෙන් වැඩි භූගෝලීය පිහිටීම
- පරිපාලන නායකත්වය සහ සහයෝගය
- MSME අයිතිකරුවන්ගේ අද්‍යාපනය, පුහුණු පසුබිම සහ ඩිජිටල් ක්‍රියාවලියකට ඇති සූදානම

**දුර්වලතා**

- MSME අන්ශයේ සේවකයින් අතර ඇති ඩිජිටල්, තාක්ශණික හා ව්‍යාපාර අන්ශ වල ඇති බරපතල නිපුණතා හිඩැස්
- උප-ජාතික මට්ටමේ නිළධාරීන්ගේ ක්‍රියාකාරීත්වය සහ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම
- නව තාක්ශණයේ සහ සන්චාරක නිශ්පාදන වල දියුණුවක් නොමැති වීම
- රාජ්‍ය අන්ශයේ පුහුණුව සැපයීම් ආධිපත්‍යය
- ප්‍රධාන හවුල් කරුවන් අතර ඇති ප්‍රමාණවත් නොවන මට්ටමේ සම්බන්ධීකරණය

**අවස්තා**

- ජාතික මට්ටමින් සන්චාරක ව්‍යාපාර ක්ශේත්‍රය විශාල ලෙස වර්ධනය වීම
- 2023 ෆෝර්බ්ස් සඟරාව මගින් සන්චාරය කිරීමට සුදුසු ප්‍රධාන රටවල් 23න් එකක් ලෙස නම් කරනු ලැබීම නිසා අන්තර්ජාතික අවධානයට පත්වීම
- ජාතික මට්ටමෙන් පළාත් වලට සුවිශේෂී ලෙස සන්චාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේදී අවධානයට ලක්වීම
- කෘෂි සන්චාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා කෘෂි හා ධීවර අන්ශ සමග සම්බන්ධ වීමට ඇති ඉඩකඩ සහ හැකියාව
- යටිතල පහසුකම් සන්වර්ධනය සඳහා ඉහළ ආයෝජනයක් සිදු කිරීම

**තර්ජන**

- මහා පරිමාණ ආර්තික අර්බුධ
- සන්වර්ධන පරිපාලනය තුළ සන්කීර්ණ බහු ආයතනික පද්ධතියක් පැවතීම
- මධ්‍යගත පරිපාලන පද්ධතියට ඇති නියාමන බාධා
- ජාතික මට්ටමින් සන්චාරක කර්මාන්තය ප්‍රවර්ධනය හා ප්‍රචාරණය කිරීම ප්‍රමාණවත් නොවීම
- විදේශ ගත වීමට ඇති කැමැත්ත ඉතා ඉහළ වීම

## 3.5 අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිපුණතා සංවර්ධන දැක්ම

අනුරාධපුර දිස්ත්‍රික් පරිපාලනය විසින් වර්ධනය කරන ලද දැක්ම සහ මෙහෙවර  පහත දැක්වේ.

**දැක්ම**

**යහපාලනයේ සහ තිරසාර සංවර්ධනයේ කැපී පෙනෙන දිස්ත්‍රික්කය බවට පත් වීම**

**මෙහෙයුම**

**" නිර්මාණාත්මක සහ නව්‍ය සම්පත් කළමනාකරණය තුළින් මිනිස් ජීවිතය සවිබල ගැන්වීමට දිස්ත්‍රික්කයට මග පෙන්වීම"**

අනුරාධපුරයෙහි නිපුණතා සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම සඳහා වන දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය අනුරාධපුර දිස්ත්‍රික්කයේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය  අනුසාරයෙන් සකස් කර ඇති අතර එය පහත දැක්වේ.

**දැක්ම**

**" මානව ප්‍රාග්ධන සංවර්ධනය තුළින් සංචාරක කර්මාන්තය ඉහළ නිපුණතා සමතුලිත මට්ටමට ගොඩ නැංවීම ."**

**මෙහෙයුම**

**" නිපුණතා සංවර්ධනය සහ ඩිජිටල්කරණය තුළින් දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම ".**

## 3.6 කුසලතා සංවර්ධනය සඳහා උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම

මෙතෙක් ඉදිරිපත් කර ඇති විශ්ලේෂණය මගින් ප්‍රතිපත්ති ප්‍රමුඛතා තුනක් අවධාරණය කරයි. පළමුව, ඉහළ, මධ්‍යම සහ අඩු කුසලතා ඇති කම්කරුවන් අතර ඇති අධික කුසලතා හිඩැස් පිළිබඳ අවධානය යොමු කිරීම සිදු කරයි.  කලාපය සඳහා වන දෙවන ප්‍රධාන ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවය වන්නේ සංචාරක අංශයේ MSME වල ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීමයි. තෙවැන්න මාතලේ දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ පූර්ණ සහභාගීත්වය සහතික කිරීම සඳහා අන්තර් ආයතනික ආධාරක පද්ධතියක් ප්‍රවර්ධනය කිරීමයි.


අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා වන නිපුණතා උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම (SSAP) සකස් කර ඇත්තේ සංචාරක අංශයේ සේවා යෝජකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, පරිපාලකයින්, පුහුණු සපයන්නන්, වෙළඳ සංගම් සහ පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන අංශයේ පාර්ශවකරුවන් ඇතුළු පාර්ශ්වකරුවන් රැසකගේ පුළුල් උපදේශන වලට අවධානය යොමු කරමිනි. මීට අමතරව, සංචාරක හා නිපුණතා සංවර්ධනය හා සම්බන්ධ ජාතික සහ උප ජාතික මට්ටම්වල සංවර්ධන ප්‍රතිපත්ති සහ ව්‍යාපාර ප්‍රතිසාධන උපාය මාර්ග ද මෙම උපාය මාර්ග සැකසීමේ අදියරේදී සැලකිල්ලට ගෙන ඇත.

SSAP හි ප්‍රධාන තේමා හතරක් යටතේ සංවර්ධනය කරන ලද උපාය මාර්ග අටක් ඇත : (අ) MSME ඔරොත්තු දීමේ හැකියාව ගොඩ නැගීම , (ආ) ආයතනික ආධාරක පද්ධතිය වැඩිදියුණු කිරීම, (ඇ) රැකියා වල බහුල ලෙස අන්තර් වර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ (d) තිරසාර සංචාරක සංවර්ධනය

දිස්ත්‍රික්කය සඳහා SSAP සංවර්ධනය කිරීමට ගෙන ඇති ප්‍රවේශය පහත (වගුව (3.2) රූපයේ දැක්වේ.

මෙම උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේදී කෙටි හා මධ්‍ය කාලීනව ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරී වැඩසටහන් මාලාවක් ඇතුළත් වේ. නිපුණතා සංවර්ධනය තුළින් ඔවුන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා නව මංපෙත් විවර කරමින් දැනට සිටින ශ්‍රමිකයන් එම අංශයේ රඳවා ගැනීම වැදගත් වේ. මේ අතර, පාසල් හැර යන අය සංචාරක අංශයේ ශ්‍රම බලකායට ඇතුළත් කර ගැනීමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය කුසලතා ලබා දීම ද වැදගත් වේ. මීට අමතරව, අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා යෝජිත නිපුණතා සංවර්ධන වැඩසටහනේ ඉලක්කගත ප්‍රතිලාභීන්ගේ කොටසක් ලෙස දිස්ත්‍රික්කයේ නුපුහුණු කාන්තාවන් සහ ආබාධ සහිත පුද්ගලයින් ඇතුළු අවාසි සහගත කණ්ඩායම් සැලකිය යුතුය.

**Figure 3.2: SSAP Framework for skills development in Anuradhapura district**



**වගුව 3.2 මූලික ඉල්ලුම් සහ සැපයුම් උපාය මාර්ග සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්වීම්**

| තේමා | උපාය මාර්ග | ප්‍රධාන මැදිහත්වීම් |
|---|---|---|
| MSME හි ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම | කම්කරුවන්ගේ මානව ප්‍රාග්ධන සංවර්ධනය | වෘත්තීය විශේෂිත පුහුණුවක් ලබා දීම |
| | | ප්‍රධාන පුහුණුකරුවන් සහ පුහුණුකරුවන්ව පුහුණුකරවන්නන්ගේ නිපුණතා සංවර්ධනය කිරීම |
| | | සංචාරක සහ සංචාරක මාර්ගෝපදේශක කුසලතා වර්ධනය |
| | MSME හි ව්‍යාපාරය පිළිබඳ ආත්ම විශ්වාසය නැවත ඇති කිරීම | ව්‍යාපාර පුහුණු සහාය ලබා දීම |
| | | MSME අයිතිකරුවන්ගේ හැකියා සහ ධාරිතා වර්ධනය කිරීම |
| | ගමනාන්ත අලෙවිකරණය | විද්‍යුත් සංචාරක ව්‍යාපාරය සහ නව තාක්ෂණ භාවිතය පිළිබඳ කුසලතා වර්ධනය කිරීම |
| ආයතනික ආධාරක පද්ධතිය වැඩිදියුණු කිරීම | හැකියා සහ ධාරිතාව වර්ධනය කිරීම | පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ කාර්ය මණ්ඩලයේ හැකියා සහ ධාරිතාව වර්ධනය කිරීම |
| | අන්තර් ආයතනික සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම | ආයතන අතර සම්බන්ධීකරණය වර්ධනය කිරීම |
| රැකියාව තුළ පොහොසත් ලෙස අන්තර් වර්ධනය ප්‍රවර්ධනය කිරීම | අවදානමට ලක්වීමට ඉඩ කඩ වැඩි කණ්ඩායම් සඳහා පුහුණුව සඳහා ප්‍රවේශය වැඩි කිරීම | කුසලතා සංවර්ධනයේ "සාධාරණ වෙනස්කම් සිදු කිරීම " පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම |
| | | පුහුණු වැඩසටහන් සඳහා ප්‍රවේශයට ඇති ඉඩකඩ වැඩි දියුණු කිරීම උදා: නම්‍යශීලී සහ මාර්ගගත ඉගෙනුම් අවස්ථා උදා - ඉ-සංචාරක පාඨමාලාව |
| | සංචාරක වටිනාකම් දාමයේ කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම | කාන්තා ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම |
| තිරසාර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම | සුවතා සහ කෘෂි සංචාරක ව්‍යාපාරයේ නිපුණතා සංවර්ධනය කිරීම | අනෙකුත් පාර්ශවකරුවන් සමග එක්ව සුවතාවය සහ කෘෂි-සංචාරක සංවර්ධනය පිළිබඳ පුහුණුව සඳහා පහසුකම් සැලසීම |

3.3 වගුවේ දක්වා ඇති ක්‍රියාකාරී සැලැස්ම දිස්ත්‍රික් මට්ටමින් සංචාරක පරිසර පද්ධතියට බලපාන අභ්‍යන්තර හා බාහිර සාධක දෙකම පිළිබඳව ආමන්ත්‍රණය කරයි. යෝජිත මැදිහත්වීම් අර්බුධයෙන් පසු ප්‍රකෘතිමත් වීමේ කාලය තුළ නැගී ආ සංවර්ධන අවස්ථා පූර්ණ ලෙස භාවිතා කරමින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයේ ශක්තීන් හරහා ක්‍රියාත්මක වීමට උත්සාහ දරයි. දිස්ත්‍රික් මට්ටමින් සංචාරක වටිනාකම් දාමයේ නිපුණතා සංවර්ධනයට බලපෑම් කළ හැකි තර්ජන සහ දුර්වලතා ඉවත් කිරීම ද එමගින් අපේක්ෂා කරයි. ඉලක්කගත ප්‍රතිලාභීන් ලෙස සංචාරක වටිනාකම් දාමයේ පුළුල් පරාසයක විහිදී සිටින ව්‍යාපාර අයිතිකරුවන් සහ සේවකයින් පෙන්වා දිය හැක. එය කාන්තාවන් සහ ආබාධිත පුද්ගලයින් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම් කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරයි.

MSME හි ඔරොත්තු දීමේ හැකියාව සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය ගොඩනැගීම සඳහා දරන ප්‍රයත්නයන් මගින් සංචාරක කර්මාන්තයේ රැකියා උත්පාදනය, ගමනාන්ත සංවර්ධනය, නිෂ්පාදන සංවර්ධනය, ප්‍රතිරූපය ගොඩනැගීම සහ ව්‍යාපාර සංවර්ධනය යන ක්ෂේත්‍රවල සැලකිය යුතු දියුණුවක් ඇති කළ යුතු වේ. කාන්තා සහභාගීත්වය සහ ආබාධ සහිත පුද්ගලයින් සවිබල ගැන්වීම පිළිබඳ මැදිහත්වීම් සමස්ත කුසලතා සංවර්ධන සැලැස්මට සියලු වර්ග වල ප්‍රතිලාභීන් හොඳින් සහ සමබරව යොදා ගැනීමක් වේ. කෙසේ වෙතත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ නිපුණතා සංවර්ධනය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඉතා සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

පාර්ශ්වකරුවන් සමග සිදු කළ සාකච්ඡා වල ප්‍රතිඵල වලින් පෙනී යන්නේ, අනුරාධපුරය එහි ස්වභාවික හා සංස්කෘතික සම්පත් අතින් පොහොසත් හා තරඟකාරී නමුත් සංචාරක අංශයේ කුසලතා සංවර්ධනයේ සහ ගමනාන්ත සංවර්ධනයේ එකහි ඇත්තේ අඩු තරඟකාරී බවකි. දිස්ත්‍රික්කයේ ඇති කුඩා ගමනාන්ත, ඉතා අඩුවෙන් සංවර්ධිත ගම් වල පිහිටා ඇති ගමනාන්ත, අභ්‍යන්තරව සැඟවී ඇති ගමනාන්ත යන මේ සියල්ලම සංචාරක ගමනාන්ත ලෙස දියුණු කිරීමට ඉතා ඉහළ ඉඩ කඩ සහ හැකියාව ඇති ස්ථාන බිව ඉහත සොයාගැනීම් වලින් පෙන්වා දෙයි. පාර්ශවකරුවන් සමග කළ සාකච්ඡා මගින් අනුරාධපුරය අඩු නිපුණතා සමතුලිතතාවයෙන් ඉහළ නිපුණතා සමතුලිතතා තත්ත්වයට සංක්‍රමණය වීමට මැදිහත් වීමක් සිදු විය යුතු ක්ෂේත්‍ර පැහැදිළිව හෙළි කරනු ලැබේ.

**වගුව 3.3 අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා සංචාරක අංශයේ නිපුණතා සංවර්ධන සැලැස්ම 2023-2024**

| | ක්‍රියාකාරී වැඩසටහන් | ඉලක්ක කණ්ඩායම | කාල සීමාව | අපේක්ෂිත ප්‍රතිඵලය | ප්‍රධාන ලෙස වගකිවයුතු ආයතන | සහායක/සහයෝගීතා නියෝජිතයින් |
|---|---|---|---|---|---|---|
| 1 | ඉවුම් පිහුම් සහ බේකරි කුසලතා වැඩි දියුණු කිරීම  | සූපවේදීන් සහ මුළුතැන්ගෙයි මෙහෙයුම් කාර්ය මණ්ඩලය | 2023 | වඩා හොඳ සේවාවක් සහ පාරිභෝගික තෘප්තිය සහතික කිරීම | SLITHM, DS, PC, TVEC VTA SLYSC | SLITHM, DS, PC, TVEC VTA SLYSC |
| 2 | මූලික ආගන්තුක සත්කාර හා බහුකාර්ය කුසලතා යනාදිය පිළිබඳව ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම  | MSME වල හිමිකරුවන්/කළමනාකරුවන් | 2023/24 | ප්‍රමිති සහතික සහිත වැඩි දියුණු කරන ලද පුහුණුව සැපයීමේ ධාරිතාව | SLITHM, VTA, NAITA, PC, DS | SLITHM, VTA, NAITA, PC, DS |
| 3 | සේවා ස්ථානය පදනම් කරගත් බහුකාර්ය කුසලතා සංවර්ධනය  | MSME වල දැනට සිටින සේවකයින් | 2023-2024 | වැඩිදියුණු කළ කාර්ය සාධනය | SLYSC, PC | S4IG |
| 4 | මූලික ඩිජිටල් කුසලතාවයන් ලබාදීම  | සංචාරක අංශයේ MSME වල සේවකයින් | 2023/24 | MSME වල ඩිජිටල් දෘශ්‍යතාව වැඩිදියුණු කිරීම | FCCISL, PC | S4IG |
| 5 | ඩිජිටල් අලෙවිකරණ කුසලතා හා සමාජ මාධ්‍ය කුසලතා ලබාදීම  | සංචාරක අංශයේ MSME වල සේවකයින් | 2023/24 | MSME වල ඩිජිටල් දෘශ්‍යතාව වැඩිදියුණු කිරීම | FCCISL, PC, DS | S4IG |

| | ක්‍රියාකාරී වැඩසටහන් | ඉලක්ක කණ්ඩායම | කාල සීමාව | අපේක්ෂිත ප්‍රතිඵලය | ප්‍රධාන ලෙස වගකිවයුතු ආයතන | සහායක/සහයෝගීතා නියෝජිතයින් |
|---|---|---|---|---|---|---|
| 6 | සංචාරක මාර්ගෝපදේශකයින් පුහුණු කිරීම  | සංචාරක මාර්ගෝපදේශකයින්<br>- රියදුරු මාර්ගෝපදේශකයින්<br>- ප්‍රදේශ මාර්ගෝපදේශකයින්<br>- සංචාරක අඩවි මාර්ගෝපදේශකයින් | 2023/24 | පාරිභෝගික තෘප්තිය වැඩි කිරීම | SLITHM, VTA, DS, PC | S4IG, SLTDA |
| 7 | ව්‍යාපාර සඳහා මඟපෙන්වීම් සහය ලබාදීම  | සංචාරක ව්‍යාපාරයේ MSME හිමිකරුවන්/ කළමනාකරුවන් | 2023/24 | වැඩිදියුණු කළ MSME කාර්ය සාධනය | FCCISL, PC | S4IG |
| 8 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි ධාරිතාවය ගොඩනැංවීම  | MSMEs | 2023/24 | MSME වල ව්‍යාපාර ප්‍රතිසාධනය | DSI, SED, NEDA | FCCISL, S4IG |
| 9 | විද්‍යුත් සංචාරක සංවර්ධන කුසලතා දියුණු කිරීම  | MSMEs | 2023/24 | වැඩිදියුණු කළ ව්‍යාපාර කාර්ය සාධනය | SLITHM, DS, PC | FCCISL |
| 10 | ව්‍යාපාර පුහුණු කිරීම, විද්‍යුත් සංචාරක ව්‍යාපාරය සහ බහුකාර්ය යනාදිය පිළිබඳ පසු විපරම් සහාය ලබා දීම  | MSMEs | 2023/24 | වැඩිදියුණු කළ ව්‍යාපාර කාර්ය සාධනය | S4IG, DS, PC | FCCISL, සංචාරක සංගමය |

| | ක්‍රියාකාරී වැඩසටහන් | ඉලක්ක කණ්ඩායම | කාල සීමාව | අපේක්ෂිත ප්‍රතිඵලය | ප්‍රධාන ලෙස වගකිවයුතු ආයතන | සහායක/සහයෝගීතා නියෝජිතයින් |
|---|---|---|---|---|---|---|
| 11 | නිපුණතා සංවර්ධනයේදී උප ජාතික මට්ටමේ කාර්ය මණ්ඩලයේ හැකියා ධාරිතාවය ගොඩනැගීම - සංචාරක ව්‍යාපාරයට ICT සහ GSI යොදාගන්නා ආකාරය, නිපුණතා සැලසුම් කිරීම යනාදිය. | දිස්ත්‍රික් මට්ටමේ කාර්ය මණ්ඩලය උදා: DC" PC සහ DS | 2023/24 | සැලසුම් කිරීමේදී කුසලතා වර්ධනය කිරීම | S4IG | DS, PC, DCS |
| 12 | ආයතන අතර සම්බන්ධීකරණය වර්ධනය කිරීම | MSMEs | 2023/24 | නිපුණතා සංවර්ධනය සඳහා ආයතනික සහයෝගය වැඩි දියුණු කිරීම / පොදු සංසදයක් සංවර්ධනය කිරීම | නිපුණතා සංවර්ධනය සඳහා ආයතනික සහයෝගය වැඩි දියුණු කිරීම / පොදු සංසදයක් සංවර්ධනය කිරීම | S4IG* |
| 13 | ව්‍යාපාර සඳහා මඟපෙන්වීම,වව්ද්‍යුත් සංචාරක කුසලතා සංවර්ධනය ,බහුකාර්ය නිපුණතා ලබාදීම පිළිබඳව පසුවිපරම් සහය ලබාදීම, උපජාතික මට්ටම් කාර්ය මණ්ඩලයේ කුසලතා සංවර්ධනය සඳහා ධාරිතාවය ගොඩනැගීම | අවදානමට ලක්විය හැකි කණ්ඩායම් | 2023/24 | අවදානමට ලක්විය හැකි කණ්ඩායම් වලට පුහුණුවීමට ප්‍රවේශවීමට ඇති ඉඩ වැඩි කිරීම | S4IG | GDO, NGOC, National SDD |
| 14 | පුහුණුව සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම (උදා, b-සංචාරක කර්මාන්තය පිළිබඳ පාඨමාලාව මාර්ගගතව ඉගෙනීම ) | MSME හිමිකරුවන්/ සංචාරක ව්‍යාපාරයේ කළමනාකරුවන් | 2023/24 | පෙර ඉගෙනුම් (RPL) සඳහා වැඩිදියුණු කරන ලද කාර්ය සාධනය , නම්‍යශීලී ඉගෙනුම් මාදිලි (FLM) | TVEC, PC SLYSC, SLITHM, | S4IG, IC |

| | ක්‍රියාකාරී වැඩසටහන් | ඉලක්ක කණ්ඩායම | කාල සීමාව | අපේක්ෂිත ප්‍රතිඵලය | ප්‍රධාන ලෙස වගකිවයුතු ආයතන | සහායක/සහයෝගීතා නියෝජිතයින් |
|---|---|---|---|---|---|---|
| 15 | කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය  | අනාගත කාන්තා ව්‍යවසායකයින් | 2023/24 | MSME සංවර්ධනය සඳහා කාන්තා සහභාගීත්වය වැඩි කිරීම | SED, NEDA, DSI | NGOC, GDO, |
| 16 | තිරසාර සංචාරක කර්මාන්තයේ කුසලතා සංවර්ධනයට සහාය වීම  | වනජීවී, සුවතා සහ කෘෂි සංචාරක ව්‍යාපාරයේ නියැලී සිටින MSMEs | 2023/24 | තිරසාර සංචාරක කර්මාන්තය සංවර්ධනය | PC, DS, | S4IG, UNDP |

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (DS)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව (DSI)
පළාත් සභාව (PC)
සංචාරක මාර්ගෝපදේශ සංගමය (Tሆ)
ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංවර්ධන නිලධාරී (GDO)
NGO සම්බන්ධීකාරක (NGOC&
කර්මාන්ත කමිටුව (IC)
ස්විට්සර්ලන්තය පදනම් කරගත් සෘෂීකඩ වැඩසටහන (RIESCO)

# 4 වන පරිච්ඡේදය

## සාරාංශය සහ නිර්දේශ



# 4.1 සමස්ත අදහස්

පෙර පරිච්ඡේදවල ඉදිරිපත් කරන ලද විශ්ලේෂණයන් පෙන්නුම් කරන්නේ අනුරාධපුරය එහි ස්වභාවික සුන්දරත්වය, උරුමයන් සහ සංස්කෘතික සම්පත්වලින් පොහොසත් හා තරඟකාරී නමුත් සංචාරක අංශයේ කුසලතා සංවර්ධනය, ගමනාන්ත සංවර්ධනය, නිෂ්පාදන විවිධාංගීකරණය සහ නවීන තාක්ෂණය භාවිතය සම්බන්ධයෙන් අඩු තරඟකාරීත්වයක් ඇති බවයි. දිස්ත්‍රික්කයේ ඉතා අඩුවෙන් සංවර්ධනය වූ ග්‍රාමීය අංශයේ කුඩා ගමනාන්ත, අභ්‍යන්තර ගමනාන්ත සහ අනෙකුත් ගමනාන්ත සඳහා ප්‍රසිද්ධ සංචාරක ගමනාන්ත බවට පත්වීමේ ඉහළ හැකියාවක් සහ ඉඩ කඩ ඇති බව ද මෙම සොයාගැනීම් මගින් යෝජනා කරයි. පාර්ශවකරුවන් සමග කළ සාකච්ඡා මගින් අඩු කුසලතා සමතුලිතතාවයෙන් ඉහළ කුසලතා සමතුලිතතා තත්ත්වයට සංක්‍රමණය වීමට බාහිර මැදිහත් වීම් සිදුවිය යුතු ක්ෂේත්‍ර හෙළි කරයි. වර්තමානයේ, කර්මාන්තය මධ්‍යස්ත මට්ටමින් ක්‍රියාත්මක වන අතර, MSME හි ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම, ආයතනික ආධාරක පද්ධතිය වැඩිදියුණු කිරීම, රැකියා අන්තර් වර්ධනයෙන් පොහොසත් කිරීම සහ තිරසාර සංචාරක සංවර්ධනය ඉලක්ක කරගත් නිපුණතා සංවර්ධන මැදිහත්වීම් හරහා එහි පූර්ණ සංවර්ධන හැකියාවන් සාක්ෂාත් කරගත හැකිය.

2021 වසරේ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා රජයේ අයවැය ප්‍රතිපාදන මගින් නැවත නැවත සිදු කළ යුතු වියදම් සඳහා (රු. මිලියන 941.1) ද, ප්‍රාග ්ධන වියදම් සඳහා (රු. මිලියන 156.75) ද ලෙස වියදම් දෙකම ආවරණය කරමින් රු මිලියන 1097.85 වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, සංචාරක ක්ෂේත්‍රය සඳහා සෘජු මුදල් ප්‍රතිපාදන නොමැති අතර එම නිසා දිස්ත්‍රික් ප්‍රගති නිරීක්ෂණ සහ කාර්ය සාධන වාර්තා තුළ මෙම අංශය වැඩි වශයෙන් ඉස්මතු කර පෙන්වා නොමැත. අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකෙහිම සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සිදුකිරීමට ද පළාත් සභාවට මුදල් ලැබෙන අතර ඒ සඳහා 2023 වසරේ ඇස්තමේන්තුගත අයවැය ප්‍රතිපාදන රු. මිලියන 35 කි.

සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම තුළින් දිස්ත්‍රික් ආදායම ඉහළ නැංවීමේ ඉහළ හැකියාවක් පවතින බැවින් මහජන මුදල් යොදවා සංචාරක අංශයේ සංවර්ධන කටයුතුවල නිරත වීමට දිස්ත්‍රික් පරිපාලනය අවධානය යොමු කිරීම වැදගත් වේ. එබැවින් දිස්ත්‍රික්කයේ අනෙකුත් අදාළ දෙපාර්තමේන්තු සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන (උදා: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව) සංචාරක සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට ඇති හැකියාව සොයා බැලීම අවශ්‍ය වේ. සංචාරක සංවර්ධන කටයුතු දිස්ත්‍රික් සංවර්ධන සැලැස්මට ඒකාබද්ධ කිරීමේදී දිස්ත්‍රික් පරිපාලනය ද නායකත්වය ගනිමින් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ යුතුය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ක්ෂේත්‍රය 2022 දී 44% කින් ප්‍රකෘතිමත් වීමත් සමඟ ඉතා ශක්තිමත් ලෙස යළි පිබිදෙමින් තිබේ. මේ අනුව දිස්ත්‍රික්කයේ ආර්ථික ප්‍රසාරණයට සහ රැකියා උත්පාදනයට දායක වීමේ හැකියාව එයට ඇත. වසංගත සහ අනෙකුත් බාහිර කම්පනයන් හමුවේ අනුවර්තනය වීමේ සහ ධෛර්යමත් වීමේ අවශ්‍යතාවය කෙරෙහි මෙහිදී අවධානය යොමු කර ඇත. සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නය සමඟ, පවතින ආර්ථික අර්බුධයෙන් ගොඩ ඒමට සහ ශ්‍රී ලංකාවේ ඉහළම ගමනාන්තයක් බවට පත්වීමට අනුරාධපුර දිස්ත්‍රික්කයට අවස්ථාව තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක අංශයේ MSMEs සඳහා වඩාත් ඔරොත්තු දෙන, අන්තර් සහ තිරසාර සංවර්ධන මාර්ග සඳහා දායක වීමට සංචාරක ව්‍යාපාරයට හැකි වන පරිදි සාමූහික ප්‍රයත්නයක් දැරීමට සහ ක්‍රියාකාරී වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීමට සුවිශේෂී අවස්ථාවක් දැන් එළඹ තිබේ.

ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිපත්ති, විධාන සහ කුසලතා සංවර්ධන උපාය මාර්ග මත SSAP පදනම් වී ඇත. එය අනුරාධපුර දිස්ත්‍රික්කයේ අන්තර් වර්ධනයේ ප්‍රධාන ධාවකයක් ලෙස සංචාරක අංශය සංවර්ධනය කිරීමේ විශේෂ දැක්මක් ඇතිව සංවර්ධනය කර ඇත. මේ සඳහා ප්‍රධාන තේමා හතරක් යටතේ උපාය මාර්ග අටක් සකස් කර ඇත. මෙයට මැදිහත්වීම් 12 ක් සහ ක්‍රියාකාරී වැඩසටහන් 16 ක් ද ඇතුළත් වේ. මෙම සෑම ක්‍රියාවකටම කාල රාමුවක් ඇති අතර ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධ කරගත යුතු ආයතන සහ පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් ද හඳුනා ගෙන ඇත. අරමුදල් ලැබීමේ ප්‍රභව දෙකක් ඇති අතර ඒවා නම් අ) දිස්ත්‍රික්කයේ සමාජ-ආර්ථික සංවර්ධනය පිණිස විවිධ ආයතන සඳහා ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් වෙන් කරන ලද රාජ්‍ය අරමුදල් සහ (ආ) ඉල්ලුම මත පදනම් වූ අන්තර් කුසලතා සන්වර්ධනය කිරීම සඳහා රාජ්‍ය නොවන ආයතන විසින් රැස් කරන ලද අරමුදල් යම් පාර්ශවකරුවන් ඔවුන් විසින් භාරදෙන ලද යෝජනා වල පළමු වටයේ වලංගුකරණයෙන් පසු ක්‍රියාකාරී වැඩසටහන් තුනක් ක්‍රියාත්මක කිරීමට (උදා: පදනම් ආගන්තුක සත්කාර, විද්‍යුත් සංචාරක ව්‍යාපාරය සහ MSME හිමිකරුවන්ගේ ධාරිතාව ගොඩනැගීම) මේ වනවිටත් ක්‍රියා කර ඇති බව සඳහන් කළ යුතුය.

# 4.1 ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම

SSAP ක්‍රියාකාරී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම බහු පාර්ශ්වීය කණ්ඩායම් ඒකාබද්ධ ව සිදු කරන අතර එබැවින් කණ්ඩායම් අතර දිස්ත්‍රික් මට්ටමින් ශක්තිමත් සම්බන්ධීකරණයක් අවශ්‍ය වේ. SSAP හි හඳුනාගෙන ඇති ක්‍රියාකාරී වැඩසටහන් ඔවුන්ගේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වලට ඇතුළත් කරන ලෙස වගකිවයුතු ආයතනවලට ඒත්තු ගැන්වීම ද අවශ්‍ය වේ. SSAP හි යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සඳහා අදාළ රේඛීය ආයතනවලින් මහජන මුදල් ලබා ගැනීමට මෙම පිහිටුවන ලද සංස්ථාව උපකාර වනු ඇත. මීට අමතරව, මෙම සැලසුම ක්‍රියාත්මක කිරීමේ අදියරේදී පුද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ පරිත්‍යාගශීලීන් සමඟ හවුල්කාරිත්වයන් වර්ධනය කිරීමේ හැකියාව ඇත. කෙසේ වෙතත් දිස්ත්‍රික් පරිපාලනයට නිපුණතා සංවර්ධනය සම්බන්ධයෙන් ඇත්තේ ඉතා අඩු අත්දැකීමකි. ඒ හා සමානව, රාජ්‍ය නොවන අංශයේ සේවා සපයන්නන්ට අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ප්‍රධාන ධාරාවේ ශ්‍රම බලකායට ඒකාබද්ධ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ඔවුන්ගේ ශක්‍යතාවය හා ධාරිතාව ගොඩනගා ගැනීමට සහාය දීම ද අවශ්‍ය වේ.

SSAP හි ඇති බහු ආයතනික ස්වභාවය අනුව, ක්‍රියාත්මක කිරීමේ අදියරේදී එහි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා පොදු සංසදයක් තිබිය යුතුය. අදාළ සියලුම පාර්ශ්වකාර ආයතන සම්බන්ධීකරණය කිරීම සඳහා මෙම සංසදයේ සභාපතිත්වය දරනු ලබන්නේ දිසාපතිවරයා හෝ ඔහු විසින් පළාත් සභාව සඳහා නම් කරන ලද තැනැත්තා විසිනි. මෙහිදී විකල්ප දෙකක් තිබේ. එනම් (අ) SSAP ක්‍රියාත්මක කිරීම ඇතුළු සංචාරක සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සංසදයක් ලෙස DCC භාවිතා කිරීම සහ (ඇ) සංචාරක සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීමට පමණක් සීමා වූ වෙනම කමිටුවක් පිහිටුවීම උදා. දිස්ත්‍රික් සංචාරක සංවර්ධන කමිටුව (DDTC*. මෙම විකල්ප දෙකෙහිම යම් වාසි සහ අවාසි තිබිය හැක. කෙසේ වෙතත්, දිස්ත්‍රික්කයේ සංචාරක සංවර්ධන ක්‍රියාකාරකම් සමමුහුර්ත කිරීම සහ වැඩ වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා නව කමිටුවක් ලෙස හෝ පවතින කමිටුවේ අනුකමිටුවක් ලෙස DTDC පිහිටුවීම මූලික අවශ්‍යතාවයක් වේ. සංචාරක කර්මාන්තයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරන දිස්ත්‍රික් කර්මාන්ත කමිටුවක් ද (DIC) තිබෙන අතර SSAP ක්‍රියාත්මක කිරීම සඳහා එයද හොඳ සංසදයක් විය හැකිය. SSAP ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වඩාත් යෝග්‍ය යාන්ත්‍රණය සොයා ගැනීම සඳහා දිස්ත්‍රික් සහ පළාත් පරිපාලනය සමඟ ඉහළ මට්ටමේ සහ ගැඹුරු සාකච්ඡාවක් සිදු කිරීම අවශ්‍ය වේ.කෙසේ වෙතත්, යෝජිත DTDC හි සංයුතිය, සංචාරක අංශය සංවර්ධනය කිරීමට බහු ආයතනික මැදිහත්වීම සහ සංචාරක අංශයේ ව්‍යාපාර ප්‍රකෘතිමත් බවට වීම හා සම්බන්ධ සමාජ-ආර්ථික ප්‍රතිලාභ සැළකිල්ලට ගනිමින් දිසාපතිවරයා විසින් තීරණය කළ යුතුය . රජයේ නිලධාරීන්ට අමතරව, සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල සහ වෙළඳ ප්‍රවර්ධන සංගම්වල නියෝජිතයින් ව මේ සදහා සහභාගී වීමට ඔවුන් තුළ ඇති කැමැත්ත මත නම් කළ හැක.

DTDC හි කාර්යභාරය/කාර්යයන් පහත සඳහන් කරුණුවලට අනුකූල විය යුතුය.

a) SSAP හි ලැයිස්තුගත කර ඇති ක්‍රියාකාරී වැඩසටහන් සඳහා ප්‍රමුඛත්වය දීම.

b) විවිධ මූලාශ්‍ර වලින් කුසලතා සංවර්ධනය සඳහා සම්පත් සම්බන්ධීකරණය කිරීම

c) ක්‍රියාකාරී වැඩසටහන්වල ප්‍රගති නිරීක්ෂණය කලින් නියම කරගත් කාල වකවානු වලදී සිදු කිරීම

d) සංචාරක කර්මාන්තයේ වෙනස්වීම්වලට ප්‍රතිචාර වශයෙන් ක්‍රියාකාරී වැඩසටහනට අවශ්‍ය වෙනස්කම්/සංශෝධන යෝජනා කිරීම සහ දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් ප්‍රතිපත්ති විධාන සහ පරිපාලන ක්‍රියා පටිපාටිවල වෙනස්කම් සිදු කිරීම

e) SSAP හි මූලික ක්‍රියාකාරකම් අදාළ අනෙකුත් අමාත්‍යාංශවල අයවැය වලට ඒකාබද්ධ කිරීම හරහා සංචාරක උප අංශයේ නිපුණතා සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම

f) වර්තමාන SSAP කාල රාමුව අවසන් වූ පසු, උගත් පාඩම් සමඟ සංචාරක නිපුණතා තව දුරටත් සංවර්ධනය සඳහා නව ක්‍රියාකාරී සැලැස්මක් සැකසීමට යාන්ත්‍රණයක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීම

# යොමු කිරීම්


- ADB" 2021' COVID-19 වලින් පසු ආර්ථික ප්‍රතිසාධනය සඳහා ප්‍රතිපත්ති ක්‍රියා: ප්‍රතිපත්ති පිළිබඳ සංක්ෂිප්ත සංග්‍රහයක්, මැනිලා.

- ADB" 2021b, COVID-19 ප්‍රතිපත්ති දත්ත සමුදාය. http://covid19policy.adb.org/policy-measures/SRI

- ADB" 2021c, COVID-19 සමඟ වසරක ජීවත් වීම: ADB සාමාජිකයින් 2020 දී වසංගතයට එරෙහිව සටන් කළ ආකාරය පිළිබඳ තක්සේරුවක්, මැනිලා'

- ADBI" 2021' COVID-19 බලපෑම් සහ ප්‍රතිපත්ති විකල්ප: ආසියානු ඉදිරිදර්ශනයක්, මැනිලා.

- බට්ලර්, ආර්. 1980. සංචාරක ප්‍රදේශ වල ජීවන චක්‍රය පරිණාමය වීමේ සන්කල්පය: සම්පත් කළමනාකරණය සඳහා ඇඟවුම්. කැනේඩියානු භූගෝල විද්‍යාඥයා, XXIV" 1(5-12'

- බට්ලර්, ආර්. 2022' COVID-19 සහ සංචාරක ගමනාන්ත සංවර්ධනයේ අදියර කෙරෙහි ඉන් ඇතිවීමට ඉඩ ඇති බලපෑම, සංචාරක ව්‍යාපාරයේ වත්මන් ගැටළු, වෙළුම. 25. අංක 10. පිටු 1682-1695

- ශ්‍රී ලංකා මහ බැංකුව, 2023. වාර්ෂික වාර්තාව 2022. ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ'

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, 2017' පස් අවුරුදු සංවර්ධන සැලැස්ම අනුරාධපුර දිස්ත්‍රික්කය, 2018-2022. අනුරාධපුර.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF). 2023' රටෙහි වාර්තාව, අංක 23/116, වොෂින්ටන්, ඩීසී

- ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD)" 2016' පොදු ආයෝජන වැඩසටහන" 2017-2020" ආර්ථික ප්‍රතිපත්ති සහ ජාතික කටයුතු අමාත්‍යාංශය, කොළඹ.

- S4IG" 2022' පශ්චාත්-COVID ප්‍රතිසාධන සන්දර්භය පිළිබඳ වේගවත් තක්සේරුව: සංචාරක වටිනාකම් දාමයේ කුසලතා සංවර්ධනය. කොළඹ.

- TVEC" 2022a' ශ්‍රී ලංකාව සඳහා සංචාරක ව්‍යාපාරය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත, 2022. කොළඹ.


- TVEC' 2022b' ශ්‍රම වෙළඳපොල බුලටින්, II වෙළුම, 2021. කොළඹ.

- TVEC" 2023a' ශ්‍රම වෙළඳපොල බුලටින්, I වෙළුම, 2022. කොළඹ.

- UNWTO" 2023' MANEWS, වෙළුම. 52, අප්‍රේල් 2023. මැඩ්රිඩ්, ස්පාඤ්ඤය.


# ඇමුණුම

### ඇමුණුම 1 – අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථාන සිතියම



ඇමුණුම 2 - අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ගමනාන්ත

**Tourist attraction sites and number of tourism sector related enterprises available in Anuradhapura district**




| | DS Division | Name of the site | Significance | Label |
|---|---|---|---|---|
| 01 | Padaviya | No.11, Urawaomarakada forest area associated to Yanoya | Wild elephant watching | A |
| 02. | Padaviya | Archeological reservation | Important archeological site | B |
| 03. | Madawachchiya | Isinbassagala Temple | A historical site | C |
| 04. | Rambewa | Kuda Rangiri Dambulu Temple | Stone inscription with historical Penal code | D |
| 05. | Nuwaragam Palatha East | Nuawara wewa | Historical tank | E |
| 06. | Nuwaragam Palatha East | Nachchaduva tank | Historical tank with a attractive park | F |
| 07. | Nuwaragam Palatha Central | Several archeological and historical sites (Sri maha Bodhi, Ruwanveli sthupa, Smadhi statue, Stone bridge, Mirsawetiya, Thisa wewa, Isurumuniya, Wessagiriya, Moon stone etc.) | Important archeological and historical sites | G |
| 08. | Wilpaththuwa (Nochchiyagama/ Mahavilachchiya) | Wild life National Park | Watching wild life and their habitats | H |
| 09. | Galnewa | Awukana statue | Historical site | I |
| 10. | Ipalogama | Kala wewa | Historical site with a fascinating environment | J |
| 11. | Mihinthale | Several archeological and historical ruins | Important archeological, historical and religious area | K |
| 12. | Palugaswewa | Horiwila | Important area for safari | L |
| 13. | Palagala | Jathika Namal Uyana | Protected area with rose quartz | M |

| Category | Number |
|---|---|
| Hotels | 110 |
| Guest Houses | 86 |
| Home stay unit | 76 |
| Restaurants | 165 |
| Transport supporting services | 74 |
| Travel agencies | 45 |
| Cultural services/Craft activities | 30 |
| Sporting and other recreational activities | 33 |
| Transport and equipment rental | 56 |
| Shops and stores | 124 |
| Spa, Wellness centers, Beauty Saloon | 85 |
| Tourist friendly eating places | 18 |

Skills for Inclusive Growth